**නියම හා කොන්දේසි**

මෙම නියම හා කොන්දේසි ("නියම හා කොන්දේසි") නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (NDB "බැංකුව") ආයතනය විසින් නිශ්චිතව දක්වනු ලබන තාක්දුරට හැර, ගිණුම්හිමියා විසින් එකම නමින් (නම්වලින්) මෙහි මින්මතු විවෘත කරනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන ("ගිණුම") ඕනෑම ආකාරයක එක් එක් සහ සෑම ගිණුමක් සඳහාම අදාළ වේ.

බැංකුව විසින් මා වෙනුවෙන් ගිණුමක්/ ගිණුම් විවෘත කිරීම සහ/හෝ එවැනි ගිණුමක්/ ගිණුම් පවත්වාගෙන යෑම සහ/හෝ මා අප/වෙත බැංකු පහසුකම් සැපයීම පිළිබඳ සැලකිල්ලට ගෙන, ගිණුම් හිමියා/ගිණුම්හිමියන් වන මා/අප විසින්, මෙම නියම හා කොන්දේසි මගින් බැඳී සිටීමට එකඟව සිටිනු ලැබේ. ගිණුම/ ගිණුම් එක් තැනැත්තකුට වැඩි තැනැත්තන් ගණනක් විසින් විවෘතකර ඇති අවස්ථාවක දී, "මම", "මට" හෝ "මාගේ" යන යෙදුම් "අපි", "අපට" හෝ "අපගේ" යන යෙදුම් ලෙස ද කියවා අවබෝධකර ගනු ලැබිය යුතුය. මෙම නියම හා කොන්දේසි මගින් එක් එක් තැනැත්තා තනි තනිවද එක් අයකු හෝ වැඩිදෙනෙකු හෝ ඔවුන්ගේ උරුමක්කරුවන්, පොල්මඃකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන් සහ පැවරුම්ලාභීන් හෝ ඔවුන් සියල්ලම සාමූහිකවද බැඳී සිටිය යුතු අතර හවුල් ගිණුම් හිමියන්ගේ සියලු ගිවිසුම්, බැඳීම් සහ වගකීම් ඒකාබද්ධව සහ වෙන් වෙන් වශයෙන් වූ ගිවිසුම්, බැඳීම් සහ වගකීම් වේ.

ඒකවචනයෙන් සඳහා වන යෙදුම් සඳහා බහුවචනද බහුවචනයෙන් සඳහන්වන යෙදුම් සඳහා ඒකවචනද පුරුෂ වචන යෙදුම් සඳහා ස්ත්‍රීලිංග වචන යෙදුම් ද ඇතුලත් වේ.

**1. මෙහෙයුම් උපදෙස්**

(i) ගිණුම්හිමියා විසින් බැංකුව වෙත පටහැනි ලෙස ලිඛිත නිවේදනයක් ලබාදෙන තෙක්, පුද්ගලික ගිණුම් විවෘත කිරීමේ ආකෘතිපත්‍රයේ සහ අතිරේක ගිණුම් විවෘතකිරීමේ ආකෘතිපත්‍ර ඇත්නම් එම අතිරේක ගිණුම් විවෘතකිරීමේ ආකෘතිපත්‍රවල ("මැන්ඩේට්පත්‍රය") ලබා දී ඇති මෙහෙයුම් උපදෙස් ප්‍රකාරව ලියා ඇති හෝ පිළිගනු ලබන අත්සන් කරන ලද උපදෙස් හෝ ලේඛන මත ක්‍රියාකිරීම සඳහා ගිණුම්හිමියා විසින් බැංකුව වෙත බලය පවරා සිටියි.

(අ) බැරකම් වශයෙන් හෝ අන්‍යාකාරයකින් ගිණුම (ගිණුම්) හරකිරීම මගින් චෙක්පත් ගෙවීම් කිරීම, විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු, නිත්‍ය නියෝග සඳහා ගෙවීම් කිරීම සෘජු හරකිරීම්, අණකර නිකුත්කිරීම, තැපැල් සහ ටෙලිග්‍රැෆික් හුවමාරු කිරීම්, සුරකුම්පත් සහ විදේශ ව්‍යවහාර මුදල් මිලදීගැනීම සහ විකිණීම මෙන්ම වෙනත් උපදෙස් සහ ශේෂය තහවුරුකිරීම් ඉල්ලා සිටීම; සහ

(ආ) ගිණුම (ගිණුම්) වසා දැමීම සඳහාවන උපදෙස් ඇතුලු ගිණුම (ගිණුම්) සම්බන්ධ වෙනත් උපදෙස් පිළිගැනීම: හවුල් ගිණුමක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී, මැන්ඩේට්පත්‍රයේ ලබා දී ඇති මෙහෙයුම් උපදෙස් පිළිබඳ නොසලකා හරිමින් (මෙහෙයුම් උපදෙස්) සියලු හවුල් පාර්ශවකරුවන් විසින් ගිණුම වසා දැමීම පිළිබඳ වූ උපදෙස් ලබාදිය යුතු වේ.

මෙහෙයුම් උපදෙස්වල යම් වෙනස්කිරීමක් හෝ අවලංගු කිරීමක් ගිණුමේ සියලු ගිණුම්හිමියන් විසින් එක්ව සිදුකල යුතු බවට ගිණුම්හිමියා එකඟව සිටියි.

## 2. ජංගම ගිණුම/ ඉතිරි කිරීමේ ගිණුම/ ස්ථාවර තැන්පතු/ NDB ඉතුරුම් සැලසුම් ගිණුම

(i) ජංගම ගිණුමක් සම්බන්ධයෙන් වන විට, බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි ගිණුම්හිමියා වෙත චෙක් පොතක් නිකුත් කරනු ලැබිය හැකි ය. චෙක් පොතක් නිකුත් කරනු ලැබුවහොත්, සියලු අවස්ථාවල දී එය සුරක්ෂිතව තබා ගැනීම පිළිබඳ වගකීම ගිණුම්හිමියා විසින් භාරගනු ලබන අතර, එම චෙක්පොත හෝ එහි අන්තර්ගත යම් චෙක්පතක්/ චෙක්පත් නැති වී හෝ සොරකම් කර ඇති අවස්ථාවක දී, ගිණුම්හිමියා විසින් ඒ පිළිබඳව වහාම බැංකුව වෙත නිවේදනය කර සිටිනු ලැබිය යුතු වේ. ගිණුමේ නිශ්කාශනය වූ අරමුදල්වලට එරෙහිව චෙක්පත් නිකුත් කිරීම සඳහා ද ගිණුම්හිමියා විසින් එකඟව සිටියි. අදාල චෙක්පත/ චෙක්පත් නැති වී ඇති අවස්ථාවක දී හෝ නීතිය මගින් අවසර දී ඇති වෙනත් අවස්ථානුගත කරුණකදී සහ බැංකුව විසින් එකඟ වී ඇති අවස්ථාවක දී (වාචිකව හෝ ලිඛිතව) චෙක්පත් ගෙවීම් නතර කිරීමේ උපදෙස් ගිණුම්හිමියාගෙන් ලබාගැනීමට බැංකුවට පරම අභිමතය පවතින බවට ද ගිණුම්හිමියා විසින් පිළිගෙන සිටියි. යම් වාචික ඉල්ලීම් සඳහා එදිනම ලිඛිත තහවුරු කිරීමක් ලබාදිය යුතු වේ. ගිණුම්හිමියාගෙන් හෝ ගිණුම්හිමියාගෙන් බවට සලකනු ලබන වෙනත් යම් තැනැත්තකුගෙන් බැංකුව විසින් එවැනි උපදෙස් භාරගනු ලබන අවස්ථාවක දී, එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ ඒ සම්බන්ධයෙන් බැංකුව විසින් දරනු ලබන යම් පාඩු, අලාභ, පිරිවැය (නෛතික පිරිවැය ද ඇතුලුව) හෝ ඉල්ලීම්වලට එරෙහිව බැංකුව හානිපූරණය කර නිදහස්ව තබනු ලබන බවට ගිණුම්හිමියා විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ.

(ii) හැකිතාක්දුරට වංචා සිදුනොවන ආකාරයෙන් ගිණුම්හිමියා විසින් චෙක්පත් ලියනු ලැබිය යුතුවේ. එමනිසා, ආසන්නතම අනාවරණයන් නොමැතිව ඉලක්කම් හෝ වචන එකතු කිරීම සිදුකල නොහැකිවන පරිදි චෙක්පත නිකුත්කරනු ලබනුයේ යම් මුදලක් සම්බන්ධයෙන් ද එම මුදල වචනවලින් සහ ඉලක්කම්වලින් සඳහන් කල යුතු වේ.

(iii) ගිණුම්හිමියා විසින්, චෙක්පොත තවදුරටත් භාවිත නොකරන අවස්ථාවක දී සහ ගිණුම වසාදමා ඇති අවස්ථාවක දී, හැකිතාක් ඉක්මණින් චෙක්පොත/ සියලු පාවිච්චි නොකල චෙක්පත්‍රිකා බැංකුව වෙත ආපසු භාරදීමට ගිණුම්හිමියා බැඳී සිටියි.

(iv) NDB බැංකුව විසින් සේවයේ යොදවා ඇති චෙක්පත් තැන්පතු යන්ත්‍ර මගින් හෝ වෙනත් යන්ත්‍ර මගින් නිකුත්කරනු ලබන තාවකාලික උපදෙස්වල කුමක් සඳහන් වුව ද, එය නොතකා, එසේ තැන්පත් කරන ලද චෙක්පත් ගිණුම්හිමියාගේ ගිණුම/ ගිණුම් වෙත බැරවී නොමැති නම් මිස, චෙක්පත් තැන්පතු යන්ත්‍රවල තැන්පත්කර ඇති බවට කියනු ලබන එකී චෙක්පත් සම්බන්ධයෙන් වූ යම් හිමිකම්පෑමක් NDB විසින් කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ හෝ කිසිදු ආකාරයක හේතුවක් නිසා විමසා බලනු නොලැබේ. ගිණුම්හිමියාගේ ගිණුම (ගිණුම්) වෙත තැන්පත් කරනු ලබන චෙක්පත් රැස්කර ගැනීමේ කාර්ය සඳහා පමණක් පිළිගනු ලබන අතර චෙක්පත් නිකුත් කල බැංකුව විසින් අදාල මුදල් නිශ්කාශනය කරනු ලබන තෙක් ආපසු ලබාගැනීම පිණිස ප්‍රතිෂ්ඨා මුදල් නොපවතිනු ඇත. සඳහන් කිරීමේ කාර්ය සඳහා පමණක් මුදල් පවතින දිනය පෙන්වා දී ඇත.

(v) බැංකුවේ අභිමතය පරිදි පමණක් චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය භාරගනු ලැබේ.

(vi) ඉහතකී යම් ගිණුමක් (ගිණුම්) සම්බන්ධයෙන් උපචිත වන යම් අයිරා පහසුකමක් හෝ වෙනත් යම් පහසුකම් සම්බන්ධයෙන් ගිණුම්හිමියා විසින් වගකීමට බැඳී සිටිනු ලබන අතර බැංකුව විසින් ස්වකීය

පරම අභිමතය කලින් කල තීරණය කරනු ලබන අනුපාතික යටතේ ඒ සම්බන්ධයෙන් දරන ලද සියලු හෝ යම් ලාභය, කොමිස් මුදල සහ වෙනත් බැංකු ගාස්තු (නෛතික පිරිවැය ද ඇතුලුව), පිරිවැය සහ වියදම්, එකී ගිණුමෙන් (ගිණුම්වලින්) හරකර ගැනීම සඳහා ගිණුම්හිමියා විසින් මෙයින් බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ. බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි නියම කරනු ලබන ආකාරයට සහ අවස්ථාවල දී, එකී මුදල් බැංකුව වෙත ගෙවීම සඳහා ගිණුම්හිමියා විසින් එකඟව සිටියි.

(vii) ඉහත ගිණුමට අදාළ යම් අයිරා පහසුකමක් හෝ වෙනත් යම් බැංකු පහසුකම් ගෙවීමට පවතින අතරතුර දී ඉහත කී ගිණුමට (ගිණුම්වලට) බැර කරනු ලබන යම් සහ සියලු මුදල්, ලාභය සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක්, ගෙවිය යුතු ලාභ මුදල් අඩුකර ගැනීම සඳහා බැංකුව විසින් පළමුව අදාල කරගනු ලැබිය යුතුය. ඉන්පසුව එසේ බැරකරනු ලබන මුදල් එකී අයිරා පහසුකම් හෝ වෙනත් යම් බැංකු පහසුකම්වල මූලික මුදල අඩුකිරීම සඳහා අදාල කරගනු ලැබිය යුතු ය.

(viii) බැංකුවේ වෙබ් අඩවියෙහි තත්කාර්ය සඳහා පූර්ව නිවේදනයක් ලබාදීම මගින් ගිණුම සම්බන්ධයෙන් හෝ බැංකුව විසින් ගිණුම්හිමියා වෙත ලබාදෙන වෙනත් යම් බැංකු පහසුකම් සම්බන්ධ බැංකුවේ සියලු සම්ප්‍රදායානුකූල ගාස්තු සහ වෙනත් ගාස්තු මෙන්ම වියදම් අයකිරීම හෝ පැනවීම සඳහා සහ බැංකුවේ සාමාන්‍ය කාර්යපටිපාටි ප්‍රකාරව අදාල ගිණුම (ගිණුම්) හරකිරීම සඳහා බැංකුවට නිතරම හිමිකම් පවතියි. යම් ගිණුමක් හෝ සියලු ගිණුම් අවසන් කිරීමෙන්/ වසා දැමීමෙන් පසුව එම ගාස්තු ආපසු ගෙවනු නොලබන බවට ගිණුම්හිමියා විසින් එකඟව සිටියි.

(ix) එකී ගිණුමට බැර කරනු ලබන තැන්පතු සහ ගිණුමෙන් සිදුකරනු ලබන හර කිරීම් ශ්‍රී ලංකාවේ කලින් කල බලපවත්නා නීතිය මගින් පාලනය වන බවත් බැංකුවට පිළිගත හැකි අනන්‍යතාවය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීමට යටත්ව සහ බැංකුව විසින් කලින් කල අයකරනු ලබන බැංකුවේ සම්ප්‍රදායානුකූල ගාස්තු ගෙවීමට යටත්ව එම මුදල් බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවනු ලැබිය යුතු බවත් ගිණුම්හිමියා විසින් පිළිගෙන සිටියි.

(x) (අදාළ වන පරිදි) ඉතුරුම්/ තැන්පතු ගිණුම (ගිණුම්) මත ගෙවනු ලබන ලාභ අනුපාතිකය, වාර්ෂික සඵල අනුපාතිකය (AER), ඉපයීම් අනුපාතිකය, ලාභ හුවමාරු අනුපාතිකය බැංකුව විසින් ශ්‍රී ලංකාවේ බැංකු ශාඛාවල/ බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කරනු ලබන අතර එම අනුපාතික එසේ ප්‍රදර්ශනය වීම ගිණුම්හිමියා වෙත ඒ පිළිබඳව කරනු ලබන නිසි දැනුම් දීමක් සංයුක්ත කරනු ලැබේ.

(xi) ඉතුරුම් ගිණුම් මත ලාභය දෛනික ශේෂය මත ගණනය කරනු ලැබ මාසිකව බැර කරනු ලබන නමුත් ඒ සඳහා එම එක් එක් ගණනය කිරීමේ දිනයේ දී ගිණුමේ (ගිණුම්වල) නියමිත අවම ශේෂය පැවතිය යුතු වේ. ජංගම ගිණුම්වල පවතින කිසිදු මුදල් ශේෂයන් සඳහා ලාභය ගෙවනු නොලැබේ.

(xii) තැන්පතු ගිණුමක් (ගිණුම්) මත ලාභය එදිනෙදා අතිරික්ත වශයෙන් හෝ (බැංකුවේ පරම අභිමතය පරිදි) බැංකුව විසින් අන්‍යාකාරයකින් තීරණය කරනු ලබන පරිදි උපචිත වන අතර එම ලාභය බැංකුව විසින් අදාල තැන්පතු ගිණුම (ගිණුම්) වෙත හෝ මා විසින් උපදෙස් දෙනු ලබන වෙනත් යම් ගිණුමක් වෙත බැර කරනු ලැබිය හැකි ය.

(xiii) ආරම්භක තැන්පතුවට, අවම ශේෂයට, ලාභ අනුපාතිකයට සහ ලාභය ගණනය කිරීමේ ක්‍රමවේදය මෙන්ම ලාභය ගිණුමට බැරකිරීමේ ක්‍රමයට අදාල නියම හා කොන්දේසි, බැංකුවේ තත්කාලයේ බලපවත්නා රීති සහ නියෝගවලට අනුකූලව විය යුතු ය. බැංකුවේ නිල වෙබ්

අඩවිය හරහා ගිණුම්හිමියා වෙත පූර්ව නිවේදනයක් ලබාදීම මගින්, බැංකුවේ පරම අභිමතය පරිදි කලින්කල රීති සහ නියෝග මෙන්ම නියම හා කොන්දේසි වෙනස්කිරීමේ / ප්‍රතිශෝධනය කිරීමේ / සුලු වශයෙන් වෙනස් කිරීමේ අයිතිය බැංකුව වෙත රඳවා තබාගනු ලැබේ.

(xiv) "තැන්පත්කරුවන් දෙදෙනාගෙන් එක් අයකු විසින් හෝ තැන්පත්කරුවන්ගෙන් එක් අයකු විසින්" මෙහෙයුම් උපදෙස් ක්‍රියාත්මක කරනු ලබන හවුල් ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, කලින්කල බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලබන අදාල ලේඛන ද සමග පිළිවෙලින් වූ තැන්පත්කරුගේ (තැන්පත්කරුවන්ගේ) මෙහෙයුම් උපදෙස් ප්‍රකාරව එවැනි ඉල්ලීමක් ලැබී ඇති අවස්ථාවකදී, අදාළ කාලසීමාව තුල දී බලපවත්නා රීති සහ නියෝගවලට යටත්ව, බැංකුව විසින් තැන්පතුව (තැන්පතු) කල්පිරීමට පෙරාතුව තැන්පතුව (තැන්පතු) ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(xv) කල්පිරීමේ දිනයට පෙරාතුව වූ වැඩකරන දින හතක් (7) ක් ඇතුලත පටහැනිව ලිඛිත උපදෙස් ලැබී නොමැති අවස්ථාවක දී, එවිට අලුත් කිරීමේ අවස්ථාවේ දී බලපවත්නා ලාභ අනුපාතිකය යටතේ සමාන කාලසීමාවක් සඳහා සියලු ස්ථාවර තැන්පතු ස්වයංක්‍රීයව අලුත්වනු ඇත. ලබාදී ඇති මෙහෙයුම් උපදෙස්වල කුමක් සඳහන් වුව ද, එය නොසලකා හරිමින්, කල්පිරීමට පෙරාතුව හෝ එසේ නොමැතිව ස්ථාවර තැන්පතුවක් ඉහළ දමන ලෙස සිදුකරනු ලබන උපදෙස් ස්ථාවර තැන්පතුවේ සියලුම ගිණුම්හිමියන් විසින් ලබාදීමට අවශ්‍ය බවට ගිණුම්හිමියා විසින් පිළිගෙන සිටියි.

(xvi) ගිණුම්හිමියා විසින් බැංකුවෙන් ඉල්ලා සිටිනු ලබන යම් කාලසීමා තුල දී බැංකුව විසින් ගිණුම්හිමියා වෙත ගිණුම් ප්‍රකාශයක් (ගිණුම් ප්‍රකාශ) එවනු ලැබිය හැකි හෝ භාරදෙනු ලැබිය හැකි බවට ගිණුම්හිමියා විසින් අවබෝධකරගෙන සිටියි. එවැනි උපදෙස් නොමැති අවස්ථාවක දී, බැංකුවේ සාමාන්‍ය බැංකුකරණ කාර්යපටිපාටි ප්‍රකාරව පිළිවෙලින් වූ ගිණුම සම්බන්ධයෙන් බැංකුව විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමාවන් තුළ දී එවැනි ගිණුම් ප්‍රකාශ යවනු ලැබේ. එම ප්‍රකාශනවල අන්තර්ගත සියලු සඳහන්කිරීම් වහාම පරීක්ෂාකර බලා එම ප්‍රකාශන සහ ගිණුම්හිමියා විසින් තබාගත් වාර්තා අතර පවතින බවට ගිණුම්හිමියා විසින් විශ්වාස කරන යම් විෂමතා ඇත්නම් ඒ පිළිබඳව අදාල ප්‍රකාශයේ දින සිට දින දාහතරක (14) කාලසීමාවක් ඇතුලත බැංකුව වෙත ගිණුම්හිමියා විසින් ලිඛිත නිවේදනයක් ලබාදීම සම්බන්ධයෙන් ගිණුම්හිමියා පරම වශයෙන් වගකියනු ලබන බවට ගිණුම්හිමියා විසින් මෙයින් එකගව සිටිනු ලැබේ. මාගෙන් එවැනි නිවේදනයක් නොලැබෙන අවස්ථාවක දී, අදාල ගිණුම් ප්‍රකාශයේ (ප්‍රකාශවල) නිවැරදිභාවය පිළිබඳව (සියලු කාර්ය සඳහා) ගිණුම්හිමියා විසින් පරම වශයෙන් එකගවී නිවැරදිභාවය සහතිකකර ඇති ලෙස සලකනු ලැබිය යුතුය. ඉහත කී කරුණුවලට අගති විරහිතව සහ මේ සම්බන්ධයෙන් බැංකුව වෙත කිසිඳු වගකීමක් පැවරීමෙන් තොරව, එකී ගිණුම් ප්‍රකාශය (ප්‍රකාශ) සම්බන්ධයෙන් බැංකුව විසින් පසුව යම් වරදක් අනාවරණය කරගනු ලැබුවහොත්, බැංකුව විසින් එම වරද අනාවරණය කරගත් වහාම, (උචිත ආකාරයට) ගිණුම්හිමියාගේ ගිණුමකින් (ගිණුම්වලින්) මුදල් හරකිරීම මගින් හෝ එවැනි (ගිණුමක්) ගිණුම් වෙත මුදල් බැරකිරීම මගින් බැංකුව විසින් එම වරද නිවැරදි කරනු ලැබිය හැකි බවට ගිණුම්හිමියා විසින් මෙයින් එකගව සිටිනු ලැබේ.

(xvii) පහත සඳහන් ආයතනවලින් ලැබෙන යම් හෝ සියලු විමසීම් සඳහා බැංකුව විසින් කැමැත්ත දක්වන්නේනම් ගිණුම්හිමියාගෙන්

විමසීමෙන් තොරව ප්‍රතිචාර දැක්වීම සඳහා ගිණුම්හිමියා විසින් බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ:- එනම්-

(අ) ගිණුම්හිමියාගෙන් විමසීමෙන් තොරව ගිණුමට (ගිණුම්වලට) අදාලව වෙනත්යම් බැංකුකරුවන්, ණය තොරතුරු කාර්යාංශය, හෝ වෙනත් යම් අධිකාරියක් හෝ නෛතික වශයෙන් බලයලත් පාර්ශවයක් විසින් සිදුකරනු ලබන විමසීම්; සැකදුරුකිරීමේ කාර්ය සඳහා එවැනි ප්‍රතිචාර දැක්වීම් සඳහා බැංකු යොමුවක් ද ඇතුළත් විය හැකි ය.

(ආ) ගිණුම්හිමියාගේ ගිණුමට (ගිණුම්වලට)/ පහසුකම්වලට අදාල බැංකුවේ යම් අයිතිවාසිකම් හෝ වගකීම් සම්බන්ධයෙන් වූ සැබෑ හෝ විභව්‍ය පැවරුම්ලාභියකු, සහභාගීවන්නකු හෝ ගිවිසුම්ගත පාර්ශවයන් විසින් සිදුකරනු ලබන විමසීම්.

(xviii) බැංකුවේ සියලු අලෙවිකරන තොරතුරු හෝ එහි භාණ්ඩ/ සේවා විස්තර, නම්කල විද්‍යුත් ලිපිනයක් හරහා, SMS මගින්, ෆැක්සිමිලි මගින්, තැපැල් මගින්, දුරකථනය හරහා ආදී වශයෙන් ලබාදීම සඳහා ගිණුම්හිමියා විසින් බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ. හවුල් ගිණුමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, නම්කල විද්‍යුත් ලිපිනය, මූලික ගිණුම් හිමියාගේ නම්කල විද්‍යුත් ලිපිනය හෝ උපදෙස් ලබාදී ඇති විද්‍යුත් ලිපිනය විය යුතු ය.

(xix) බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි ස්වකීය ක්‍රියාකාරකම් තුන්වන පාර්ශවයක් වෙත පැවරිය හැකි මෙන්ම එම තුන්වන පාර්ශවය වෙත ගිණුම (ගිණුම්) පිළිබඳ තොරතුරු සපයනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් ගත්කල ගිණුම්හිමියා පිළිබඳ, ගිණුම (ගිණුම්) සහ/ හෝ ගණුදෙනුව (ගණුදෙනු) පිළිබඳ වන තොරතුරු සකස් කිරීම සඳහා, හුවමාරු කිරීම සඳහා සහ ගබඩා කිරීම සඳහා හෝ බැංකුවේ පාලිත සමාගම් වෙත සහ අනුබද්ධ ආයතන වෙත තොරතුරු සම්ප්‍රේෂණය කිරීම හෝ බැංකුව විසින් සේවයේ යොදවනු ලබන යම් ආයතනයක් හෝ නියෝජිතයකු හෝ තුන්වන පාර්ශවයක් සමග එම තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා බැංකුවට අවශ්‍යවන බවට සහ ඒ සඳහා බැංකුවට බලය පවරන බවට ගිණුම්හිමියා (ගිණුම්හිමියන්) විසින් අවබෝධකරගෙන සිටිනු ලැබේ.

(xx) ගිණුම්හිමියාගේ අවසන්වරට වාර්තා වී ඇති ලිපිනය වෙත වැඩකරන දින දාහතරක් (14) ඇතුලත ලිඛිත දැන්වීමක් ලබා දීමෙන් පසුව තත්කාර්ය සඳහා හේතු දැක්වීමෙන් තොරව යම් ගිණුමක් විවෘත කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා හෝ යම් ගිණුමක් වසා දැමීම සඳහා බැංකුව විසින් තමාවෙත අයිතිය රඳවා ගනු ලැබේ.

(xxi) බැංකුව විසින් ස්වකීය අවශ්‍යතාවය පරිදි හෝ අධිකරණයක නියෝගයක් අනුව හෝ පරිපාලනමය නියෝගයක් ප්‍රකාරව හෝ අන්‍යාකාරයකින් ගිණුම්හිමියා වෙත පූර්වයෙන් දැනුම් දීමෙන් තොරව හෝ ගනුදෙනුකරුගේ යම් වගකීමක් උල්ලංඝනය කිරීම සඳහා යටත්වීමෙන් තොරව, යම් ගිණුමක් (ගිණුම්) සම්බන්ධ ගනුදෙනු අවසන් කිරීම, තහනම්කිරීම හෝ අත්හිටුවීම කරනු ලැබිය හැකි ය.

(xxii) අඛණ්ඩ මාස විසිහතරක (24) කාලසීමාවක් තිස්සේ ගිණුම්හිමියා විසින් කිසිදු ගනුදෙනුවක් සිදුකර නොමැති විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ද ඇතුලු යම් ජංගම හෝ ඉතුරුම් ගිණුමක් **"අක්‍රීය ගිණුම්"** වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

(xxiii) (කලින් කල බැංකුව විසින් තීරණය කරනු ලබන සහ බැංකුවේ වෙබ් අඩවියේ පළකරනු ලැබිය හැකි) අවම ශේෂය පවත්වාගෙන යනු නොලබන එවැනි ගිණුමක් (ගිණුම්), ගිණුම්හිමියාගේ අවසන්වරට වාර්තාගතව ඇති ලිපිනය වෙත දින දාහතරක (14) කාලයක් සඳහා

ලිඛිත නිවේදනයක් ලබාදීමෙන් පසුව වසා දැමීමේ අයිතිය බැංකුව වෙත රඳවාගනු ලැබේ.

(xxiv) බැංකුවේ වෙබ් අඩවියෙහි පූර්ව නිවේදනයක් ලබාදීම මගින් බැංකුවේ අභිමතය පරිදි කලින්කල වෙනස්වීමට යටත් වන්නා වූ අවම ශේෂයක් පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවක් සෑම ගිණුමක් (ගිණුම්) සඳහාම තිබිය හැකි වේ. මා විසින් එකී අවම ශේෂය සපුරාලනු නොලැබුවහොත්, එම ගිණුම (ගිණුම්) මත බැංකුව විසින් සේවා ගාස්තුවක් සහ/හෝ වෙනත් යම් අදාළ ගාස්තු පනවනු ලැබිය හැකිය. තත්කාලයේ බලපවත්නා ගාස්තු පැනවීම් අදාල වන්නේ ය.

(xxv) බැංකුව විසින් නියම කරනු ලබන ලේඛනමය සාක්ෂි ද සමග බැංකුව වෙත අදාල සිදුවීම පිළිබඳ ලිඛිත නිවේදනයක් ලැබී ඇත්නම් මිස සහ ලැබෙනතෙක් මිස, ගිණුම්හිමියාගේ මරණය සිදුවීම, අසමත්කම හෝ බංකොලොත්භාවය (හෝ වෙනත් යම් සමාන සිදුවීමක් හෝ ක්‍රියාවක් සිදුවීම) සිදුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ගිණුම්වලට අදාල ගනුදෙනු සම්බන්ධයෙන් සිදුවන පාඩුවක් සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබිය යුතුය. තව ද රජයේ හෝ රාජ්‍ය නියෝජිත ආයතනයක හෝ අධිකාරියක ක්‍රියාකලාපය අනුව පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හේතුකාරක වන යම් පාඩුවක්, අලාභයක් හෝ ප්‍රමාදයක් සම්බන්ධයෙන් හෝ යම් ලිඛිත නීතියක් ප්‍රකාරව හෝ (වැඩවර්ජන, කම්හල් ක්‍රියාකාරකම්, උපාංග අක්‍රියවීම හෝ බලසැපයුම් බිඳවැටීම වැනි ඊට සීමා නොවන කරුණු ඇතුලු) බැංකුවේ පාලනයෙන් පරිභාහිර ක්‍රියාවන් හේතුවෙන් බැංකුව විසින් යම් ක්‍රියාවක් සිදුකර තිබීම හෝ යම් ක්‍රියාවක් සිදු නොකර තිබීම හේතුවෙන් සිදුවන යම් පාඩුවක්, අලාභයක් හෝ ප්‍රමාදයක් සම්බන්ධයෙන් බැංකුව ගිණුම්හිමියා වෙත වගකියනු නොලැබිය යුතුය. ඉහතකී සිදුවීම් මගින් සිදුවිය හැකි බවට අපේක්ෂිත ප්‍රමාදයන් සම්බන්ධයෙන් බැංකු ශාඛාවල නිවේදන පළකිරීම මගින් හෝ අන්‍යාකාරයකින් ස්වකීය ගණුදෙනුකරුවන් වෙත පොදුවේ දැනුම්දීම සඳහා බැංකුව විසින් සෑම උත්සාහයක්ම දරනු ලැබේ.

(xxvi) යම් ගණුදෙනුකරුවකු විසින් බාලවයස්කරුවකු වෙනුවෙන් ගිණුමක් විවෘත කරනු ලබන අවස්ථාවක දී, මෙම නියම හා කොන්දේසිවලට අමතරව, එකී ගිණුමට අදාල නියම හා කොන්දේසි පිළිගැනීමට ගණුදෙනුකරු එකඟව සිටියි.

(xxvii) ගිණුම්හිමියාගේ මරණය සිදුවීමේදී හෝ හවුල් ගිණුම් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී ගිණුම්හිමියන්ගෙන් යම් ගිණුම්හිමියකු මියයන අවස්ථාවක දී, එම අවස්ථාවේ පැවති බැංකු ශේෂය, ඇපකර සම්බන්ධයෙන් උපචිත වන බැංකුවේ ලියන් අයිතිය, ගාස්තු, ප්‍රතිඥා, හිලව්කිරීම්, ප්‍රතිහිමිකම්පෑම් හෝ අන්‍යාකාර කවර හෝ කරුණක් සම්බන්ධයෙන් බැංකුව විසින් යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීමට යටත්ව හෝ යම් තැනැත්තකු විසින් සිදුකරන හිමිකම් පෑමක් ප්‍රකාරව බැංකුව විසින් ගනු ලැබීමට සුදුසු බවට සලකන යම් පියවරකට යටත්ව පමණක් ඉහතකී ගිණුමට අදාල ජීවත්ව සිටින තැනැත්තාට (තැනැත්තන්ට) ලැබිය යුතු සහ/හෝ එම ජීවත්ව සිටින තැනැත්තාගේ (තැනැත්තන්ගේ) බැර ශේෂය බැංකුව විසින් නිදහස් කරනු ලබන බවට ගිණුම්හිමියා විසින් මෙයින් ප්‍රතිග්‍රහණයකර පිළිගෙන සිටිනු ලැබේ.

(xxviii) සැකකටයුතු ගණුදෙනු සහ සීමා ඉක්මවනු ලබන ගණුදෙනු පිළිබඳව අදාල අධිකාරිය වෙත වාර්තා කිරීමේ අයිතිය බැංකුව විසින් තමාවෙත රඳවාගනු ලැබේ.

(xxix) ගිණුම්හිමියා වෙත පූර්ව දැනුම්දීමක් ලබාදීම මගින් අවම සාමාන්‍ය බැරකම් ශේෂය වෙනස්කිරීම සඳහා, සංශෝධනය කිරීම සඳහා,

වැඩිකිරීම සඳහා හෝ අඩුකිරීම සඳහා බැංකුවට හිමිකමක් පවතින බවට ගිණුම්හිමියා විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ.

**නමා ආයෝජන සැලසුම් ගිණුම**

(xxx) ගණුදෙනුකරු විසින් තනිව හෝ හවුලේ ආයෝජන සැලසුම් ගිණුමක් විවෘත කරනු ලැබිය හැකි ය.

(xxxi) පළමු මාසික වාරිකය ආරම්භක තැන්පතුවක් ලෙස හෝ එක්වර කරනු ලබන තැන්පතුවක් සමග පළමු මාසික වාරිකය ආරම්භක තැන්පතුවක් ලෙස ලබාදීම යටතේ එක් එක් නමා ආයෝජන සැලසුම් ගිණුමක් විවෘත කරනු ලැබිය හැකි අතර ඒ සඳහා නමා ආයෝජන ඉතුරුම් සැලසුම් සහතිකපත්‍රයක් නිකුත් කරනු ලැබේ. එම සහතිකපත්‍රය ගිණුම්හිමියා විසින් තමාභාරයේ තබාගත යුතු අතර එම සහතිපත්‍රයෙහි සුරක්ෂිතභාවය ගිණුම්හිමියාගේ වගකීම වන අතර කල්පිරීමේ දී මෙම සහතිකපත්‍රය බැංකුව වෙත භාරදීම අනිවාර්ය වේ. නමා ආයෝජන ඉතුරුම් සැලසුම් සහතිකපත්‍රය නැතිවී, සොරකමට ලක්වී හෝ අස්ථානුගතව ඇති අවස්ථාවක දී ගිණුම්හිමියා විසින් වහාම ඒ පිළිබඳ බැංකුව වෙත දැනුම්දිය යුතු අතර වලංගු දිව්රුම් ප්‍රකාශයක් ද සමග පිළිගත හැකි පැහැදිලි කිරීමක් ලැබීමේ දී බැංකුව විසින් එම සහතිකපත්‍රය වෙනුවට අලුත් අනුපිටපත් සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(xxxii) ගිණුම කල්පිරීමේ දී, නමා ආයෝජන සැලසුම් සහතිකපත්‍රය ඉදිරිපත් කිරීමෙන් පසුව, ගිණුමේ පවතින මුදල් සම්බන්ධයෙන් ගිණුම්හිමියා විසින් ලබාදී ඇති උපදෙස් ප්‍රකාරව ක්‍රියා කරනු ලැබිය යුතුය. ගිණුම්හිමියා සතුවන ගෙවීම් ලබා ගැනීමේ විකල්ප ක්‍රම වනුයේ-

(i) මුදලින් ගෙවීම ලබා ගැනීම.

(ii) ගිණුම්හිමියාගේ NDB ගිණුම වෙත මුදල් පැවරීම.

(iii) SLIPS හරහා ගෙවීම් අණකර නිකුත් කිරීම හෝ අරමුදල් පැවරීම වේ.

(xxxiii) කල්පිරීමේ දී ගිණුම්හිමියා විසින් එකඟවූ ඉතුරුම් වටිනාකම ඉල්ලා නොසිටින අවස්ථාවක දී, ගිණුම්හිමියාගේ තත්කාලයේ පවතින NDB ගිණුමක් වෙත කල්පිරීම් ප්‍රතිශ්‍ය‍ා මුදල් පැවරීමේ අයිතිය බැංකුව වෙත රඳවා තබාගනු ලැබේ.

(xxxiv) බැංකුවේ වෙනත් යම් නියම හා කොන්දේසිවල පටහැනිව කුමක් අන්තර්ගත වුවද, එම නියම හා කොන්දේසි නොතකා හරිමින්, නමා ආයෝජන සැලසුම් ගිණුමේ ගිණුම් ප්‍රකාශය, ගිණුම්හිමියා විසින් බැංකුව වෙත අවසන්වරට තහවුරුකර ඇති විද්‍යුත් ලිපිනයට කාර්තුමය වශයෙන් ගිණුම්හිමියා වෙත විද්‍යුත් තැපැලෙන් යොමු කරනු ලැබේ.

(xxxv) මාසික ප්‍රකාශ ලබාගැනීමේ විකල්පය ගිණුම්හිමියා විසින් තෝරාගෙන ඇති අවස්ථාවක දී, එම මාසික ප්‍රකාශ ගිණුම්හිමියා වෙත මාසිකව විද්‍යුත් තැපැලෙන් යොමුකරනු ලැබේ.

(xxxvi) මාසික වාරිකය ගෙවිය යුතු දිනය ආරම්භක තැන්පතු දිනයෙන් එක් මාසයකට (01) පසුව එළඹෙන දිනය විය යුතු ය.

(xxxvii) මාසික වාරිකය ගෙවිය යුතු දිනයේදී මාසික වාරිකය ගෙවනු ලබන බවට සහතිකවීම ගිණුම්හිමියාගේ වගකීම වේ. මාසික වාරිකය ලැබිය යුතු දිනයේ දී බැංකුව වෙත මාසික වාරික ලැබී නොමැති නම්, ගිණුම් හිමියාට සැලසුම් කළ අගයට ලඟාවිය නොහැකි විය හැකි ය.

(xxxviii) මෙම ගිණුමේ බැරට චෙක්පත් හෝ බැංකු අණකර භාරගනු නොලැබේ.

(xxxix) දායකත්ව කාලසීමාව තුළ දී ගිණුම්හිමියාගේ මරණය සිදුවුවහොත්, ආයෝජන සැලසුම් ගිණුම අවසන් කරනු ලැබේ.

එවැනි අවස්ථාවක දී, ඒ මත අදාළ වන ව්‍යවස්ථාපිත බදු සහ ගාස්තුවලට යටත්ව සහ මෙහි "ච(iii)" වගන්තියේ සඳහන් විධිවිධානවලට යටත්ව මරණය සිදුවූ අවස්ථාව දක්වා තැන්පත්කර ඇති දායක මුදල්, උපයාගත් ලාභය ද සමග නාමිකයා වෙත ගෙවනු ලැබේ.

(xl) එවැනි නාමිකයකු නොමැති අවස්ථාවකදී, එම තැන්පතුවේ පවතින දායකමුදල බෙදාදීම ශ්‍රීලංකාවේ බලපවත්නා නීතිය ප්‍රකාරව සිදුකල යුතු වේ.

(xli) ගිණුම්හිමියා තත්කාලයේ බලපවත්නා රඳවුම්බදු (WHT) නීති සඳහා යටත් නොවන අවස්ථාවක දී, අපේක්ෂිත ලාභ අනුපාතිකය යටතේ බැංකුව විසින් ප්‍රමාණවත් ලාභ උපයාගෙන තිබීමට යටත්ව එවැනි ගිණුම්හිමියන් කල්පිරීමේ කාලසීමාවේ දී සැලසුම් කළ ඉලක්කගත මුදල ලබාගැනීම සඳහා යෝග්‍ය වන්නේ ය. ගිණුම්හිමියා තත්කාලයේ බලපවත්නා WHT (රඳවුම්බදු) අඩුකිරීම් සඳහා යටත්වන අවස්ථාවක දී, මාසික ලාභය WHT අඩුකිරීම් සඳහා යටත්විය යුතු මෙන්ම කල්පිරීමේ දී අවසාන ඉලක්කගත මුදල එම අඩුකිරීම් සඳහා යටත් වන්නේ ය.

(xlii) කල්පිරීමේ දිනය තෙක් නමා ආයෝජන සැලසුම් ගිණුමෙන් කිසිදු මුදලක් ආපසු ලබාගැනීම සඳහා අවසර දෙනු නොලැබේ. ගිණුම්හිමියා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසුව, ගිවිසුම අවසන් කිරීමේ දී තක්හාරුජ් ඇගයීම් සලකුණු ප්‍රතිපත්තිය මත පදනම්ව බැංකුව විසින් අන්‍යොන්‍ය වශයෙන් මුදරබා ඉතුරුම් ලාභ හුවමාරු අනුපාතිකය සමග එකඟවීම හෝ බැංකුව විසින් බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි, ක්‍රියා කිරීම සිදු කළ හැකි වේ.

(xliii) ගිණුම්හිමියා විසින් මාසික වාරික මුදල ගෙවනු නොලබන අවස්ථාවකදී සහ/හෝ ගෙවීම් සිදුකිරීම අඛණ්ඩව පවත්වාගෙන යනු නොලබන අවස්ථාවක දී, ආයෝජන සැලසුම් ගිණුමට අදාළ වන අපේක්ෂිත ලාභ අනුපාතිකය වෙනස්වීමට යටත් වේ.

(xliv) එකවර සිදුකරනු ලබන තැන්පතු මුදලට හෝ මාසික වාරික මුදලට වඩා ඉහල අතිරේක මුදලක් ගිණුම්හිමියා විසින් ගිණුමට ලබාදී ඇත්නම්, බැංකුවේ බලපවත්නා අපේක්ෂිත ලාභ අනුපාතිකය අදාළ වේ.

**හවුල් ගිණුම්;**

(xlv) හවුල් ගිණුමක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී, සහතික පත්‍රයෙහි මූලික ගිණුම් හිමියාගේ සහ 01 වන හවුල් ගිණුම් හිමියාගේ නම් පමණක් සඳහන් විය යුතු ය.

(xlvi) එම හවුල්ගිණුම් හිමියන්ගෙන් එක් හවුල් ගිණුම් හිමියකුගේ හෝ හවුල් ගිණුම්හිමියන් වැඩි දෙනකුගේ හර ගිණුමක්, හවුල් ගිණුම්හිමියන් විසින් නම්කරනු ලැබිය යුතු ය.

(xlvii) හවුල් ගිණුම්හිමියකුගේ මරණය සිදුවන අවස්ථාවක දී, නමා ආයෝජන සැලසුම් ගිණුම ද අවසන් කරමින් වකාලා ගිවිසුම අවසන් වන ලෙස සලකනු ලැබිය යුතු ය. හවුල් ගිණුම්වල (i) වන වගන්තියට අනුකූලව උපචිත වූ ලාභය ද සමග මූලික මුදල ජීවත්ව සිටින ගිණුම්හිමියා වෙත මුදාහරිනු ලැබිය යුතු වේ.

(xlviii) ගිණුම කල්පිරීමේ දී ගිණුම වසා දැමීම සඳහා ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් බැංකුව වෙත ලිඛිත උපදෙස් ලබාදිය යුතු වේ.

(xlix) දිනය අවසානයේ දී ලාභය ගිණුමට බැරකරනු ලබන බැවින්, කල්පිරීමේ දිනයට පසුව එළඹෙන දිනයේ දී ගිණුම්හිමියා විසින් කල්පිරීමේ වටිනාකම රැස්කරගනු ලැබිය හැකිවේ.

(l) තැන්පත් කිරීම සඳහා සහ බැංකුවේ තැන්පත් කිරීම සඳහා වන අපගෙන් එක් අයකුට හෝ අප සියලු දෙනාට ගෙවිය යුතු හෝ අයත්වන ලෙස සලකනු ලබන යම් හෝ සියලු චෙක්පත්, නෝට්ටු හෝ වෙනත් ගෙවීම් සාධන පත්‍ර පිටසන් කිරීම සඳහා එක් එක් හවුල් ගිණුම්හිමියන් එකිනෙකා අතර මෙයින් බලය ලබා දී බලය පවරා සිටිනු ලබන අතර, ඒ අනුව පිටසන් කිරීම් නොමැතිව බැංකුව වෙත එවැනි සාධන පත්‍ර ලැබී ඇති අවස්ථාවක දී, අප වෙනුවෙන් එවැනි සාධන පත්‍ර පිටසන් කිරීම සඳහා සහ එම සාධන පත්‍ර ගිණුම (ගිණුම්) වෙත බැර කිරීම සඳහා බැංකුව වෙත මෙයින් බලය පවරා සිටිනු ලබන අතර එවැනි යම් ගිණුමකට (ගිණුම්) වලට අදාළ මෙහෙයුම් උපදෙස් එම සාධන පත්‍ර අත්සන් කිරීමට නියමිත ගිණුම්හිමියා සංයුක්ත වන තනිපුද්ගලයන්ගෙන් ඕනෑම අයකු සඳහා අදාළ වේ.

(li) හවුල් ගිණුම් හිමියන්ගෙන් යම් තැනැත්තකුගේ මරණය සිදු වී ඇති අවස්ථාවක දී, එකී හවුල් ගිණුම් හිමියාගේ ගිණුමේ (ගිණුම්වල) බැරට පවතින මුදල් ජීවත්ව සිටින ගිණුම්හිමියා (ගිණුම්හිමියන්) වෙත මුදාහරිනු ලබන අතර බැංකුවට පිළිගත හැකි නිසි සාක්ෂි සමග මරණය පිළිබඳ නිසි නිවේදනයක් බැංකුව වෙත ලැබෙන තෙක්, මෙහෙයුම් උපදෙස් ප්‍රකාරව මුදල් ගෙවීම සඳහා කිසිදු හවුල් ගිණුම් හිමියකු (ගිණුම් හිමියන්) විසින් බැංකුව වගකීමට යටත් නොකළ යුතු ය.

(lii) හවුල් ගිණුම්හිමියන් දෙදෙනාගෙන් එක් අයකු හෝ හවුල් ගිණුම්හිමියන්ගෙන් එක් අයකුගේ මියයෑම පිළිබඳව බැංකුව වෙත නිවේදනය වීමෙන් පසුව, අපගේ ඕනෑම ආකාරයක ගිණුමක (ගිණුම්වල) බැරට පවතින හෝ බැංකුව විසින් දරනු ලබන සියලු මුදල්, සුරකුම්පත්, ඔප්පු, ලේඛන සහ වෙනත් දේපළ හවුල් ගිණුම්හිමියන්ගෙන් ජීවත්ව සිටින තැනැත්තා වෙත හෝ ජීවත්ව සිටින තැනැත්තන් වෙත ගෙවීමෙන් හෝ භාරදීමෙන් හෝ එම ජීවත්ව සිටින්නාගේ හෝ සිටින්නන්ගේ නියමය පරිදි ගෙවීමෙන් හෝ භාරදීමෙන් පසුව බැංකුව ස්වකීය වගකීම්වලින් සම්පූර්ණයෙන් නිදහස් කරනු ලැබිය යුතු බවට එක් එක් හවුල් ගිණුම්හිමියා විසින් පිළිගෙන සිටිනු ලැබේ.

(liii) ගිණුම (ගිණුම්) මත හෝ අන්‍යාකාරයකින් දරන ලද යම් අයිරා පහසුකමක් හෝ වෙනත් බැඳීම් එක් එක් හවුල් ගිණුම් හිමියාගේ ඒකාබද්ධ සහ වෙන් වෙන් වශයෙන් වූ වගකීමක් වන්නේ ය. හවුල් ගිණුමක් සම්බන්ධයෙන් වන විට, නම් කල ඊමේල් ලිපිනය මූලික ගිණුම් හිමියාගේ ඊමේල් ලිපිනය හෝ උපදෙස් දෙනු ලබන ඊමේල් ලිපිනය විය යුතු ය.

**3. දුරකථනයෙන් ෆැක්සිමිලි සහ/හෝ ඊමේල් මගින් ලැබෙන බැංකු උපදෙස්**

(i) (4 වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුවද එම උපදෙස් නොසලකා හරිමින්) ගිණුම්හිමියා විසින් බැංකුව වෙත පටහැනිව ලිඛිත උපදෙස් ලබා දී ඇත්නම් මිස, ෆැක්සිමිලි යන්ත්‍රයක් හෝ නම් කල ඊමේල් ලිපිනයක් හරහා සම්ප්‍රේෂණය වන (පටහැනිව ප්‍රකාශිතව අන්‍යාකාර උපදෙස් ලබා දී ඇත්නම් මිස මෙම නියම හා කොන්දේසිවලට අදාලව මා විසින් නියම කරනු ලබන හෝ ලබාදෙන උපදෙස් ඇතුලුව) මාගේ බැංකු උපදෙස් මත බැංකුව විසින් ක්‍රියා කිරීමට බැංකුව පරම වශයෙන් බැඳී නොසිටිය ද ඒ සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ. ගිණුම්හිමියා විසින් බැංකුව වෙත ලබාදෙන මෙහෙයුම් උපදෙස් ප්‍රකාරව, එවැනි ඊමේල් පණිවුඩ සමග ගිණුම්හිමියාගේ උපදෙස්වල අත්සන් තබා පරිලෝකනය කරන ලද පිටපතක් ද අන්තර්ගත විය යුතුය. මෙම කාර්ය සඳහා නම් කල ඊමේල් ලිපිනය, බැංකුව වෙත සපයා ඇති ගිණුම් හිමියාගේ/ගිණුම් හිමියන්ගේ ඊමේල් ලිපිනය විය යුතුය. ගිණුම් හිමියා/ ගිණුම්

හිමියන් විසින් පත් කරනු ලබන ඇටෝර්නි බලකරුවන් සඳහා මෙය අදාළ නොවේ.

(ii) ගිණුම්හිමියා විසින් බැංකුව වෙත ලිඛිතව පටහැනි උපදෙස් ලබාදී ඇත්නම් මිස, බැංකුව විසින් ක්‍රියාකිරීමට බැඳී නොසිටිය ද පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන්වූ ගිණුම්හිමියාගේ දුරකථන උපදෙස් මත ක්‍රියාකිරීම සඳහා බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ; එනම් -

(අ) ගිණුම්හිමියාගේ යම් ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම. (එසේ වුවද හවුල් ගිණුමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී එක් පාර්ශවයක් විසින් අත්සන් කිරීම සඳහා වන අත්සන් කිරීමේ උපදෙස් පවතීනම් පමණක් ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සඳහා අවසර දෙනු ලැබේ.) එවැනි අවස්ථාවල දී, මුදල් හුවමාරු කිරීම ගිණුම්හිමියාගේ හවුල් ගිණුම/ගිණුම් සහ/හෝ තනිපුද්ගල ගිණුම/ගිණුම් අතර විය යුතු ය.

(ආ) ගිණුම්හිමියාගේ ගිණුමට/ගිණුම්වලට අදාළ ගිණුම් ප්‍රකාශ, චෙක් පොත් සහ චෙක්පත් ගෙවීම් නතර කිරීමේ ඉල්ලීම්.

(iii) පහත දැක්වෙන කරුණුවල ප්‍රතිඵලයක් වශයෙන් හෝ ඒ හා සම්බන්ධයෙන් ඕනෑම ආකාරයකින් උපචිත වන සියලු සිවිල් නඩු පැවරීම්, අපරාධ නඩු පැවරීම්, නීති කෘත්‍ය, පිරිවැය, හිමිකම්පෑම්, ඉල්ලීම්, ගාස්තු, වියදම්, පාඩු හා වගකීම් වලට එරෙහිව ගිණුම්හිමියා විසින් බැංකුව නිදහස් කර හානි පූරණය කර තබනු ලබන බවට එකඟව සිටිනු ලැබේ; එනම්-

(අ) සන්නිවේදන හෝ සම්ප්‍රේෂණ මගින් යම් උපදෙස් වැරදි ලෙස ලබා දී ඇති හෝ සම්ප්‍රේෂණය කර ඇති හෝ වංචාසහගත ලෙස වෙනස් කර ඇති, වැරදි ලෙස අවබෝධ කරගනු ලබන හෝ විකෘති කරන ලෙස සලකනු ලැබූවද එය නොසලකා හරිමින්, ෆැක්සිමිලි හරහා, නම් කළ ඊමේල් ලිපියක් හරහා හෝ දුරකථනයෙන් ගිණුම්හිමියා විසින් යවනු ලබන උපදෙස් මත බැංකුව විසින් සද්භාවයෙන් ක්‍රියා කිරීම; සහ

(ආ) යැවීමේ හෝ ලැබීමේ යන්ත්‍රයේ දෝෂයක් හෝ බිඳවැටීමක් හා සම්බන්ධිත යන ඕනෑම හේතුවක් නිසා බැංකුව වෙත තොරතුරු සම්ප්‍රේෂණය නොවීම හෝ නොලැබීම හේතුවෙන් ගිණුම්හිමියාගේ ලිඛිත උපදෙස්, දුරකථන උපදෙස්, ෆැක්සිමිලි හෝ ඊමේල් උපදෙස (උපදෙස්) ප්‍රකාරව ක්‍රියාකිරීමෙන් බැංකුව වැළකී සිටීම; හෝ

(ඇ) බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලබන කාලසීමාවක් ඇතුළත බැංකුව වෙත ෆැක්සිමිලි උපදෙසෙහි (උපදෙස්වල) සියලු මුල් පිටපත් හෝ ටෙලිග්‍රැෆික් උපදේශයේ (උපදෙස්වල) ලිඛිත තහවුරුකිරීම් ලබාදීමට ගිණුම්හිමියාට නොහැකි වීම.

(iv) (පවත්නා අවස්ථානුගත කරුණු පිළිබඳ නොසලකා හරිමින්) තොරතුරු ලබාදෙන තැනැත්තාගේ හෝ තොරතුරු ලබා දෙන බවට සලකනු ලබන තැනැත්තාගේ අධිකාරී බලය හෝ අනන්‍යතාවය පිළිබඳ සහ තොරතුරු ලැබීමේ කාලය පිළිබඳව විමසා බැලීම සඳහා හෝ දුරකථනය හරහා ෆැක්සිමිලි හෝ ඊමේල් මගින් බැංකුව වෙත ලබාදෙන උපදෙස් හෝ නියමයන්හි තත්‍යභාවය හෝ අන්‍යාකාර කිසිවක් සනාථ කිරීම සම්බන්ධයෙන් බැංකුව කිසිදු ආකාරයකින් වගකීමට බැඳී නොසිටිය යුතුය. ෆැක්සිමිලි සහ ඊමේල් පණිවුඩ හෝ දුරකථන උපදෙස් ලැබීමේ කාලය සහ දිනය මත බැංකුව විසින් ගනු ලබන තීරණ ගිණුම්හිමියා විසින් පිළිගෙන සිටියි.

(v) බැංකුව සමග අත්සන්කර ඇති ගිණුම්හිමියාගේ ආදර්ශ අත්සනට හෝ ගිණුම්හිමියාගේ ඇටෝර්නි බලකරුගේ හෝ බැංකුවේ වාර්තාගතකර ඇති ගිණුම්හිමියාගේ බලයලත් අත්සන්කරුවන්ගේ ආදර්ශ අත්සනට

අනුකූල බවට බැංකුවට පෙනී යන අත්සනක් දරනු ලබන යම් ෆැක්සිමිලි උපදෙස් හෝ නියමයන් බැංකුවේ වාසිය වෙනුවෙන් ගිණුම්හිමියාගේ උපදෙස් හෝ නියමයන් ලෙස තීරණාත්මක වශයෙන් උපකල්පනය කරනු ලැබිය යුතු ය.

(vi) ගිණුම්හිමියා විසින් නිකුත් නොකළ හෝ ගිණුම්හිමියා විසින් බලය පවරනු නොලැබූ එහෙත් ගිණුම්හිමියාගේ උපදෙස් හෝ නියමයන් හෝ ගිණුම්හිමියා විසින් බලය පැවරූ උපදෙස් හෝ නියමයන් ලෙස බැංකුව විසින් සද්භාවයෙන් සලකනු ලබන දුරකථන, ෆැක්සිමිලි හෝ ඊමේල් උපදෙස් හෝ නියමයන් මත බැංකුව විසින් ක්‍රියාකිරීම හේතුවෙන් ගිණුම්හිමියා විසින් දරනු ලබන යම් පාඩුවක් සම්බන්ධයෙන් බැංකුව වගකීමට බැඳී සිටිනු නොලැබේ. එසේ වුව ද, බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි ගිණුම්හිමියාගේ දුරකථන උපදෙස්, ෆැක්සිමිලි උපදෙස් හෝ ඊමේල් උපදෙස් හෝ නියමයන් මත ක්‍රියාකිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(vii) දුරකථන, ෆැක්සිමිලි හෝ ඊමේල් උපදෙස් හෝ නියමයන් පිළිගැනීම සඳහා වූ බැංකුවේ අධිකාරී බලය අඛණ්ඩ අධිකාරී බලයක් වන අතර එම අධිකාරී බලය අවසන් කරන ලෙස ගිණුම්හිමියාගෙන් බැංකුව වෙත ලිඛිත නිවේදනයක් ලැබෙන තෙක් එම අධිකාරී බලය නොවෙනස්ව පවතියි.

(viii) දුරකථන, ෆැක්සිමිලි සම්ප්‍රේෂණ හෝ ඊමේල් පණිවුඩ ක්‍රමවේදය එකී උපදෙස් හා නියමයන් ලබා දීමේ සුරක්ෂිත ක්‍රම නොවන බවත්, එම ක්‍රමවල අන්තර්ගත අවදානම පිළිබඳ ගිණුම්හිමියා විසින් දැන සිටින බවත්, බැංකුව විසින් එම දුරකථන, ෆැක්සිමිලි හෝ ඊමේල් උපදෙස් හෝ නියමයන් පිළිගන්නා ලෙස සහ ඒ මත ක්‍රියාකරන ලෙස ගිණුම්හිමියා විසින් ඉල්ලා සිටිනුයේ ගිණුම්හිමියාගේ පහසුව සඳහා බවත් එසේ ඉල්ලා සිටීම ගිණුම්හිමියාගේ පරම අවදානම් දැරීම මත පවතින බවත් ගිණුම්හිමියා විසින් පිළිගෙන සිටියි.

(ix) ගිණුම්හිමියාගේ සහ බැංකුවේ සම්බන්ධතා ආරක්ෂාකිරීමේ කාර්ය සඳහා බැංකුව විසින් ලබාදෙන සහ බැංකුව වෙත ලැබෙන දුරකථන ඇමතුම් පටිගත කරනු ලැබිය හැකි බවට ගිණුම්හිමියා විසින් කරුණු දැනුවත්ව පිළිගෙන සිටිනු ලැබේ.

(x) ටෙලිග්‍රැෆික් උපදෙස (උපදෙස්) සම්බන්ධයෙන් වූ බැංකුවේ ක්‍රියාකාරකම් ගිණුම්හිමියාගේ සම්පූර්ණ ප්‍රතිලාභය උදෙසා සිදුවන බවත් ඒ සම්බන්ධ අවදානම සහ වගකීම ගිණුම්හිමියා සතුවන බවත්, දුරකථනය මගින් හෝ ඔහුගේ/ඇයගේ කටහඬ මගින් උපදෙස් ලබාදෙන තැනැත්තා බැංකුව විසින් සහ/හෝ එහි සේවානියුක්තිකයන් විසින් හඳුනාගැනීමට නොහැකි වීම පිළිබඳ නොසලකා හරිමින්, දුරකථනය මගින් බැංකුව වෙත උපදෙස (උපදෙස්) ලබාදීම සම්බන්ධයෙන් ගිවිසුමක හෝ තෝරතයක හෝ අන්‍යාකාරයකින් පැනනගින කිසිදු ආකාරයක අලාභ හෝ වන්දි සම්බන්ධයෙන් බැංකුව සහ/හෝ එහි සේවා නියුක්තිකයන් වගකීමට බැඳී නොසිටිය යුතු වේ.

**4. දුරකථන /ඊමේල් /ෆැක්සිමිලි හරහා ගිණුම් ශේෂ /ගිණුම් තොරතුරු සැපයීම සම්බන්ධයෙන් වූ හානිපූරණය**

(i) බැංකු කාර්යාල වේලාවන් තුළදී දුරකථනයෙන්, හෝ වෙනත් අවස්ථාවලදී ඊමේල් හරහා (අත්සන් කර පරිලෝකනය කරන ලද උපදෙස්) හෝ ෆැක්සිමිලි මගින් හෝ වෙනත් ක්‍රමයකින් ගිණුම් ශේෂය සහ/හෝ ගිණුම්හිමියාගේ ගිණුමට (ගිණුම්වලට) අදාල වෙනත් තොරතුරු ගිණුම්හිමියා වෙත හෝ ගිණුම්හිමියාගේ නියෝජිතයන්ට ලබාදෙන ලෙස ගිණුම්හිමියා විසින් බැංකුවෙන් ඉල්ලා සිටිනු ලැබේ. දුරකථනයෙන් හෝ ඊමේල් හෝ ෆැක්සිමිලි මගින් තොරතුරු ලබාගැනීමේ

අවදානම පිළිබඳ ගිණුම්හිමියා දැන සිටින අතර බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි එම තොරතුරු ගිණුම්හිමියා වෙත/ ගිණුම්හිමියාගේ නියෝජිතයන් වෙත සපයනු ලබන බව ගිණුම්හිමියා විසින් පිළිගෙන සිටියි.

(ii) ඉහත කී කරුණු සම්බන්ධයෙන් බැංකුවේ ක්‍රියාකාරීත්වය ගිණුම්හිමියාගේ ප්‍රතිලාභය වෙනුවෙන් සහ ගිණුම්හිමියාගේ අවදානම් දැරීම සහ වගකීම යටතේ සිදුවන බව ගිණුම්හිමියා විසින් මෙයින් පිළිගෙන ප්‍රකාශ කර සිටිනු ලැබේ. ගිණුම්හිමියාගේ උපදෙස් හෝ නියමයන් බවට හෝ ගිණුම්හිමියා විසින් බලය දෙන ලද උපදෙස් බවට බැංකුව විසින් සද්භාවයෙන් සලකනු ලබන්නා වූ ද, එහෙත් ගිණුම්හිමියා විසින් ලබා නොදුන් හෝ ගිණුම්හිමියා විසින් ඒ සඳහා බලය ලබා නොදුන් ගිණුම්හිමියාගේ උපදෙස් හෝ නියමයන් මත ක්‍රියාකරමින් වුව ද දුරකථනයෙන්, ෆැක්සිමිලි හෝ ඊමේල් මගින් ගිණුම්හිමියා වෙත ගිණුම් ශේෂය/ ගිණුම් විස්තර දැනුම්දීමට අදාළව යම් ගිවිසුමක හෝ තෝරතයක හෝ අන්‍යාකාරයකින් උපචිත වන කිසිදු පාඩුවක්, හෝ අලාභයක් සම්බන්ධයෙන් බැංකුව සහ/හෝ එහි සේවානියුක්තිකයන් වගකීමට බැඳී නොසිටිය යුතු බවට ගිණුම්හිමියා විසින් මෙයින් එකඟව ප්‍රකාශ කර සිටිනු ලැබේ.

(iii) දුරකථනය හරහා තොරතුරු ලබා ගැනීමේ සේවය පැවතීම නතර කිරීම සඳහා ගිණුම්හිමියා විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, ගිණුම්හිමියා විසින් ඒ පිළිබඳව බැංකුව වෙත ලිඛිතව දැනුම්දිය යුතු වේ.

(iv) ඉහත කී ආකාරයෙන් එම පහසුකම/ සේවාව අනුව ලබාදෙන/ ලබාදෙන බවට සලකනු ලබන උපදෙස් බැංකුව විසින් පිළිගැනීම හෝ එම උපදෙස් ක්‍රියාත්මක කිරීම සලකා බැලීමේ දී, එම පහසුකම හෝ සේවාව මගින් ලබාදෙන බවට සලකනු ලබන යම් උපදෙසක් (උපදෙස්) බැංකුව විසින් පිළිගැනීම හෝ ක්‍රියාත්මක කිරීම හේතුවෙන් බැංකුව විසින් අවස්ථාවෝචිත පරිදි සිදුකරන ලද/ බැංකුවට එරෙහිව ලබාදෙන හෝ බැංකුව විසින් විඳින ලද/ දරන ලද සියලු නිවේදන, ඉල්ලීම්, හිමිකම්පෑම්, සිවිල් හෝ අපරාධ නඩු මෙන්ම සියලු අලාභ, පාඩු, පිරිවැය, ගාස්තු සහ වියදම් ඇත්නම් ඒ සියල්ලෙන් ගිණුම්හිමියා විසින් බැංකුව නිදහස් කර හානිපූරණය කර තබනු ලැබේ.

**5. තැපැල් අයිතම රඳවා තබාගෙන සිටීම**

(i) ගිණුම්හිමියා විසින් මෙම සේවය සඳහා ඉල්ලීමක් කරනු ලැබීමේ දී බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි ගිණුම්හිමියා වෙත යොමු කරන ලද සියලු තැපැල් අයිතම රඳවා තබාගෙන සිටිනු ලැබිය හැකි අතර එවැනි තැපැල් අයිතම ගිණුම්හිමියා විසින් ලබාගෙන ඇති ලෙස සලකනු ලැබිය යුතුය. බැංකුව වෙත ලිඛිතව ගිණුම්හිමියා විසින් පටහැනි උපදෙස් ලබා දී ඇත්නම් මිස, එසේ දරන ලද එම තැපැල් අයිතම ගිණුම්හිමියා විසින් පුද්ගලිකව හෝ යම් බලයලත් තැනැත්තකු මගින් භාරගනු ලැබේ. මෙම සේවය සඳහා සාධාරණ ගාස්තුවක් අයකිරීමට හා බැංකුව විසින් යෝග්‍ය බවට සලකනු ලබන ආකාරයට එම තැපැල් අයිතම රඳවා තබාගැනීම, විවෘත කිරීම සහ/ හෝ පාලනය කිරීම සඳහා බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ. එවැනි යම් තැපැල් අයිතම ලබාගැනීමට ගිණුම්හිමියා විසින් අපොහොසත් වුවහොත්, ගිණුම්හිමියාගේ අවදානම් දැරීම සහ පිරිවැය දැරීම යටතේ බැංකුව වෙත අවසන්වරට වාර්තා කර ඇති ලිපිනයට එම තැපැල් අයිතම බැංකුව විසින් ගිණුම්හිමියා වෙත ආපසු භාරදෙනු ලැබිය හැකි අතර එසේ ක්‍රියාකිරීමේ දී සියලු වගකීම් හෝ බැඳීම්වලින් බැංකුව නිදහස් කර තබනු ලැබිය යුතු ය.

(ii) ගිණුම්හිමියා විසින් යම් තැපැල් අයිතම එක්රැස් කරගනු ලබන තෙක් එම තැපැල් අයිතමවල අන්තර්ගතය පිළිබඳ ගිණුම්හිමියා වෙත කිසිදු දැනීමක් නොතිබුණි වුව ද සහ

මෙහි නෛතික ප්‍රතිවිපාක හෝ බැංකුව සමග පවතින ගිණුම්හිමියාගේ අයිතිවාසිකම්වලට බලපෑමක් සිදුවුව ද, එවැනි ප්‍රතිවිපාක පිළිබඳ අවදානම ගිණුම්හිමියා විසින් භාරගෙන සිටිනු ලැබේ. එවැනි ප්‍රතිවිපාකවල අවදානම ගිණුම්හිමියා විසින් දැරිය යුතු වේ.

(iii) බැංකුව විසින් දරනු ලබන තැපැල් අයිතමවල අන්තර්ගත කරුණු පිළිබඳ ගිණුම්හිමියාගේ නොදැනුවත්භාවය සියලු කාර්ය සඳහා සහ බැංකුව සමග ගිණුම්හිමියාගේ ගිණුම (ගිණුම්) අවසන් කිරීමට පෙර හෝ ඉන්පසුව සියලු අධිකරණවලදී බැංකුවේ හිමිකම්වලට එරෙහිව වූ විත්තිවාචකයක් නොවන මෙන්ම අනාගතයේ එසේ විත්තිවාචකයක් නොවනු ඇත.

**6. මූල්‍ය උපදේශන සේවා**

(i) බැංකුව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වගකියනු නොලැබිය යුතු බවට ගිණුම්හිමියා විසින් එකඟව සිටිනු ලැබේ; එනම්-

(අ) ආයෝජන වටිනාකමෙහි යම් අඩුවීමක් හෝ වැඩිවීමක් පිළිබඳව.

(ආ) සපයනු ලබන තොරතුරු හෝ ලේඛනවල නිවාරදිභාවය, ප්‍රමාණවත්භාවය හෝ සම්පූර්ණභාවය පිළිබඳව

(ඇ) එම අලාභ සිදුවීමේ හැකියාව පිළිබඳව බැංකුව විසින් දැනුවත්ව සිටීම පිළිබඳ නොසලකා හරිමින් සහ ගිවිසුමක, වගකීමක, තෝරතයක (අතපසු කිරීම ඇතුලු), බරපතල වගකීමක හෝ අන්‍යාකාර ඕනෑම ස්වභාවයක ක්‍රියාකාරකමක් පිළිබඳ නොසලකා හරිමින්, මූල්‍ය උපදේශන සේවය තුළින් හෝ එම සේවය භාවිත කිරීම තුළින් උපචිත වන යම් ලාභ අහිමිවීම්, අවස්ථා අහිමිවීම් හෝ යම් ඍජු, ආනුෂංගික, හේතුකාරක, විශේෂ, දැඩි හෝ සැලකිය යුතු අලාභ පිළිබඳව.

**7. හිලව් කිරීමේ සහ ඒකාබද්ධ කිරීමේ අයිතිවාසිකම්**

බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දී සහ කලින් කල වෙන් වෙන්ව හෝ වෙනත් යම් තැනැත්තකු සමග ඒකාබද්ධව බැංකුව සමග පවතින ගිණුම්හිමියාගේ සියලු හෝ යම් ගිණුමක් (ගිණුම්) සහ වගකීම්, නිවේදනය කිරීමකින් තොරව බැංකුව විසින් ඒකාබද්ධ කිරීම හෝ මූලික හෝ ඇපකර වශයෙන් හෝ සැබෑ හෝ අවිනිශ්චිත, මූලික හෝ සම්පාර්ශ්වික, වෙන්වෙන්ව හෝ වෙනත් යම් තැනැත්තකු සමග ඒකාබද්ධව වූ බැංකුව වෙත පවතින ගිණුම්හිමියාගේ වගකීම් ගෙවා නිරාකරණය කිරීම සඳහා (කල්පිරුණු හෝ එසේ කල්නොපිරුණු) බැංකුව සමග පවතින ගිණුම්හිමියාගේ තැන්පත් ද ඇතුලුව ගිණුමේ (ගිණුම්වල) බැරට පවතින සියලු හෝ යම් මුදල් බැංකුව විසින් හිලව් කිරීම කරනු ලැබිය හැකි අතර බැංකුව විසින් තත්කාලයේ පවතින බැංකුවේ හුවමාරු අනුපාතිකය යටතේ යම් අවශ්‍ය ව්‍යවහාර මුදල් පරිවර්තන කටයුතු ද සිදු කළ හැකිය. ගිණුම්හිමියාගේ මරණය හෝ බංකොලොත්භාවය සිදුවීම මගින් බැංකුවේ අයිතිවාසිකම්වලට බලපෑමක් නොවිය යුතු ය.

**8. හානිපූරණය**

බැංකුව විසින් බැංකු පහසුකම් සැපයීමේ දී; හෝ යම් ගිණුමක් (ගිණුම්) සම්බන්ධයෙන් හෝ පොදුවේ මෙම නියම හා කොන්දේසි සම්බන්ධයෙන් හෝ මෙම නියම හා කොන්දේසි බලාත්මක කිරීමේ දී සහ බැංකුවට ලැබිය යුතු මුදල් අයකර ගැනීමේ දී; හෝ ඕනෑම ආකාරයක නෛතික කටයුත්තක දී බැංකුව විසින් දරන ලද මුදල් අයකර ගැනීමේ දී ඕනෑම ආකාරයකින් උපචිතවන (නෛතික ගාස්තු ද ඇතුලුව) සියලු පිරිවැය සහ වියදම්වලට එරෙහිව බැංකුව

සම්පූර්ණයෙන් හානිපූරණය කර තැබීමට ගිණුම්හිමියා විසින් එකඟව සිටිනු ලැබේ.

## 9. ව්‍යවස්ථාපිත ප්‍රකාශය/විනිමය පාලන නියෝගය

ගිණුම්හිමියා විසින්;

(අ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන සාමාජිකත්ව ආකෘතිපත්‍රය මත ගිණුම්හිමියාගේ බදු තත්ත්වය පිළිබඳ ව්‍යවස්ථාපිත ප්‍රකාශය සම්පූර්ණ කිරීම සඳහා එකඟව සිටියි.

(ආ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිශ්චිතව දක්වනු ලබන අනුපාතිකයන් හෝ අනුපාතික යටතේ කාලසීමාව සඳහා ගෙවිය යුතු ලාභයෙන් බැංකුව විසින් ලාභ ගෙවීම් මත වූ රැඳවුම් බද්ද අඩුකරනු ලබන බවට ගිණුම්හිමියා විසින් එකඟව සිටියි.

(ඇ) මෙහි අන්තර්ගත සියලු නියම හා කොන්දේසි විනිමය පාලන පනතේ විධිවිධානවලට හෝ කලින් කල ඒ යටතේ සාදනු ලබන නියෝගවලට යටත් වන බවට ගිණුම්හිමියා විසින් එකඟව සිටියි.

## 10. PRVS/PRV/ ඉහල දැමීම් සේවය අවසන් කිරීම

එක් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවය වෙත ලිඛිත නිවේදනයක් ලබාදීම මගින් බැංකුව විසින් හෝ ගිණුම්හිමියා විසින් මෙම PRVS/PRV/ ඉහල දැමීමේ සේවය භාවිත කිරීම අවසන්කරනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවක දී ගිණුම්හිමියා විසින් ප්‍රමාදයකින් තොරව හෝ තවදුරටත් වූ ඉල්ලාසිටීමකින් තොරව;

(අ) ගිණුම්හිමියා වෙත නිකුත් කර ඇති සියලු කාඩ්පත් සහ චෙක්පොත් බැංකුව වෙත ආපසු භාරදිය යුතු වේ.

(ආ) එම සේවය අවසන්කිරීම නොසලකා හරිමින්, ගිණුම්හිමියා විසින් සම්පූර්ණයෙන්ම වගකිව යුතු (ගෙවීම් සඳහා එම අවස්ථාව වනවිට බැංකුව වෙත ඉදිරිපත් කර නොමැති අයිතමවල වටිනාකම ඇතුලුව) ඒ යටතේ වූ සියලු ආශ්‍රිත ගාස්තු සමග අයිරා පහසුකම්, ක්‍රෙඩිට්කාඩ් පත (කාඩ්පත්) සහ වෙනත් ණය පහසුකම් ඇතුලු ඊට සීමා නොවන්නා වූ බැංකුව වෙත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගිණුම්හිමියා විසින් බැංකුව වෙත ගෙවිය යුතු වේ. ඉහත කී පොදු කරුණු ව්‍යාප්තියට සීමා වීමෙන් තොරව, ගිණුම්හිමියාගේ මරණය හෝ බංකොලොත්භාවය සිදුවන අවස්ථාවක දී, එකී සියලු මුදල් (තවදුරටත් ඉල්ලා සිටීමෙන් තොරව) වහාම අයවිය යුතු සහ ගෙවිය යුතු වේ.

(ඇ) එම ගිණුම් සම්බන්ධයෙන්වූ නියමිත සීමාවන් පවත්වාගෙන නොයෑම මගින් බැංකුව විසින් හෝ ගිණුම්හිමියා විසින් මෙම PRVS/PRV/ ඉහල දැමීම් සේවය අවසන් කරනු ලබන හෝ PRVS/PRV/ ඉහල දැමීම් සේවයේ ගනුදෙනුකරුවකු වීම අවසන් වන අවස්ථාවක දී, පුද්ගලික ගිණුම්වලට අදාළ පොදු නියම හා කොන්දේසිවලට යටත්ව, එම ගිණුම (ගිණුම්) සාමාන්‍ය බැංකු ගිණුමක් (ගිණුම්) බවට පරිවර්තනය වන බවට ගිණුම්හිමියා විසින් පිළිගෙන සිටිනු ලැබේ.

## 11.ගාස්තු

සපයන ලද සේවා සම්බන්ධයෙන් හෝ පැකේජය සම්බන්ධයෙන් ගනු ලබන යම් පියවර සඳහා ගෙවිය යුතු සියලු පරිපාලන, පාලන, සේවා, මූල්‍ය හෝ වෙනත් ගාස්තු ගිණුම්හිමියා විසින් බැංකුව වෙත ගෙවිය යුතු බවටත් එම කාර්ය සඳහා බැංකුව විසින් කලින් කල නියම

කරනු ලබන අනුප්‍රමාණ අනුව එම ගාස්තු අයකරනු ලැබිය යුතු බවටත් එම ගාස්තු ගිණුම්හිමියාගේ ගිණුමෙන් හරකරනු ලැබිය හැකි බවටත් ගිණුම්හිමියා විසින් එකඟව සිටිනු ලැබේ. බැංකුව විසින් කලින්කල නිශ්චය කරනු ලබන සියලු ලාභ අනුපාතික, පරිපාලන, පාලන සේවා, මූල්‍ය හෝ වෙනත් ගාස්තු බැංකුවේ වෙබ් අඩවියේ පලකරනු ලබන බවට ගිණුම්හිමියා දැනුවත්ව සිටිනු ලැබේ.

**12. අත්හැරීම්**

යම් නිශ්චිත අවස්ථාවක් හෝ සිදුවීමක් සම්බන්ධයෙන් මෙම නියම සහ කොන්දේසි කිසිවක් බැංකුව විසින් ඉවසා දරා සිටීම, අතපසුකිරීම හෝ අත්හැරීම එම නියම හා කොන්දේසි දැඩි ලෙස බලාත්මක කිරීම සඳහා ඉන්පසුව වූ බැංකුවේ අයිතියට අගතිගාමී නොවිය යුතුය. බැංකුව විසින් සිදුකරනු ලබන කිසිදු අත්හැරීමක් ලිඛිතව සිදුකරන්නේ නම් මිස බලාත්මක නොවිය යුතු ය.

**13. නිවේදන**

(i) මෙම නියම හා කොන්දේසිවල අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැර, මෙම නියම හා කොන්දේසි යටතේ හෝ බැංකු පහසුකම් සඳහා වූ යම් ඉල්ලීමකට අනුව බැංකුව විසින් ඉදිරිපත් කරනු ලබන හෝ නිකුත් කරනු ලබන සෑම ඉල්ලීමක්ම හෝ සන්නිවේදනයක්ම ලිඛිතව විය යුතු මෙන්ම ගිණුම්හිමියා විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති ලිපිනයට එම ඉල්ලීම හෝ සන්නිවේදනය යොමු කරනු ලැබිය යුතු අතර, පසුව ගිණුම්හිමියා විසින් වෙනත් ලිපිනයක් ලිඛිතව නිවේදනය කර ඇත්නම් මිස, එසේ යොමු කල එම ඉල්ලීම හෝ සන්නිවේදනය ගිණුම්හිමියා වෙත ලැබී ඇති ලෙස සලකනු ලැබිය යුතුය. හවුල් ගිණුම් හිමියකු සම්බන්ධයෙන් වන අවස්ථාවකදී, මූලික ගිණුම් හිමියා විසින් ලබාදෙන ලිපිනය වෙත නිවේදන භාරදිය යුතු අතර තැපැල්කර ඇති අවස්ථාවක දී, එසේ තැපැල්කල දිනයෙන් පසුව එළඹෙන දිනයේ දී එම නිවේදනය ලැබී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(ii) බැංකුවේ වෙබ් අඩවියෙහි පළකිරීම මගින් ඕනෑම අවස්ථාවකදී මෙම නියම හා කොන්දේසි වෙනස් කිරීම සඳහා හෝ එම නියම හා කොන්දේසි සඳහා යම් එකතු කිරීම් සිදු කිරීම සඳහා බැංකුව වෙත අයිතිය රඳවාගෙන ඇති බවට ගණුදෙනුකරු විසින් මෙයින් කැමැත්ත ලබාදී පිළිගෙන සිටිනු ලැබේ.

**14. විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්/ ගණුදෙනු**

(i) විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් (ගිණුම්) විවෘත කිරීම සඳහා කලින් කල විදේශ විනිමය දෙපාර්තමේන්තුව සහ/හෝ එවැනි අධිකාරියක් විසින් නියම කරනු ලබන නිශ්චිත තොරතුරු සහිත ලිපිලේඛන අවශ්‍ය බව ගිණුම්හිමියා විසින් අවබෝධකරගෙන සිටිනු ලැබේ. එසේ නියම කරනු ලබන නිශ්චිත ලිපිලේඛන බැංකුව සමග ගිණුමක් (ගිණුම්) විවෘත කිරීමට පෙරාතුව ගිණුම්හිමියා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ii) ඉදිරි වෙන්කිරීමේ ගනුදෙනු සහ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම (ගිණුම්) ඇතුලු විදේශ සංචාරක කාඩ්පත් (FTC) නිකුත් කිරීම, විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම, ශ්‍රී ලංකා රුපියල් ගිණුම/ ගිණුම් සඳහා සහ එවැනි ගිණුම/ ගිණුම් වලින් ප්‍රතිමුඛ ප්‍රේෂණ සහ ආමුඛ ප්‍රේෂණ සිදු කිරීම සහ විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සිදුකිරීම, බැංකුව විසින් වගකීමට හෝ බැඳීමට යටත් නොවන්නා වූ ද, පූර්ව නිවේදනයකින් තොරව කලින් කල වෙනස් විය හැකි විදේශ විනිමය දෙපාර්තමේන්තුව සහ/හෝ එවැනි යම් අධිකාරියක් විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ මගින් පොදුවේ පාලනය කරනු ලබන බවට ද ගිණුම්හිමියා විසින් අවබෝධකරගෙන සිටිනු ලැබේ.

(iii) ඉදිරි වෙන් කිරීමේ ගනුදෙනු ඇතුලුව විදේශ ව්‍යවහාර මුදලින් පවත්වාගෙන යනු ලබන ගිණුමක් (ගිණුම්) සහ/හෝ විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු වලට ආශ්‍රිත අවදානම් තිබිය හැකි බව ගිණුම්හිමියා විසින් පිළිගෙන සිටියි. ඒ අනුව, එවැනි යම් ගිණුමක් (ගිණුම්) සහ/හෝ විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවක් (ගනුදෙනු) සම්බන්ධයෙන් උපචිත වන ජාත්‍යන්තර හෝ දේශීය නෛතික හෝ නියාමන සීමා කිරීම් ඇතුලුව ඊට සීමා නොවන්නා වූ ඕනෑම ආකාරයකින් උපචිත වන සියලු අවදානම් සහ පිරිවැය මෙන්ම වියදම් සඳහා ගිණුම්හිමියා විසින් පරම වශයෙන් බැඳී සිටින බවට ගිණුම්හිමියා විසින් පිළිගෙන සිටින අතර එවැනි බැංකු ගනුදෙනුවලින් උපචිත වන යම් පාඩු හෝ අලාභවලට එරෙහිව බැංකුව හානිපූරණය කර තැබීමට ගිණුම්හිමියා විසින් එකඟව සිටියි. එම ගිණුම (ගිණුම්) මත මුදල් ආපසු ගැනීම් හෝ ගනුදෙනු කටයුතු ද බැංකුවේ අදාල ශාඛාවේ පවතින අදාල ව්‍යවහාර මුදල් සඳහා යටත් වේ. එක් ව්‍යවහාර මුදලකින් තවත් ව්‍යවහාර මුදලකට මුදල් පරිවර්තනය කිරීම බැංකුව විසින් කලින් කල (ස්වකීය පරම අභිමතය පරිදි) තීරණය කරනු ලබන විනිමය අනුපාතිකය අනුව සිදුකරනු ලැබේ.

**15. නාමයෝජනා**

නාමයෝජනා පිළිබඳ නියම හා කොන්දේසි වෙනම ලේඛනයක් වන්නා වූ නාමයෝජනා ආකෘති පත්‍රයේ නිශ්චිතව දක්වා ඇත.

**16. ඇමරිකා එක්සත් ජනපදයේ විදේශ ගිණුම් බදු අනුකූලතා පනත (FATCA)**

(i) තොරතුරු හෙළිදරව් කිරීම සඳහා වූ නියම කිරීම් සමග අනුකූලව ක්‍රියාකිරීමේ වගකීමක්/ බැඳීමක් බැංකුව වෙත පනවා ඇති අවස්ථාවක දී, ගිණුම්හිමියා විසින් විවෘත කරනු ලබන/ පවත්වාගෙන යනු ලබන/ සිදු කරන සහ/හෝ වසාදමනු ලබන ගිණුමක් (ගිණුම්) පිළිබඳ සියලු තොරතුරු ගිණුම්හිමියාගෙන් විමසීමෙන් පසුව හෝ එසේ විමසීමකින් තොරව ඇමරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර ආදායම් සේවය (IRS) වෙත හෝ ඇමරිකා එක්සත් ජනපදයේ වෙනත් යම් නියාමන අධිකාරියක් හෝ වෙනත් යම් කලාපයක් වෙත වාර්තා කිරීම සඳහා ගිණුම්හිමියා විසින් බැංකුව වෙත මෙයින් බලය පවරා සිටිනු ලැබේ.

(ii) (සංශෝධිත) ශ්‍රී ලංකාවේ 1988 අංක 30 දරන බැංකු පනතේ 77 වන වගන්තියේ විධිවධාන ප්‍රකාරව මෙම කැමැත්ත ප්‍රදානය කරනු ලැබේ.

(iii) මාගෙන් තවදුරටත් කැමැත්ත ලබා ගැනීමෙන් තොරව වෙනත් කලාපයක්/කලාප විසින් පනවා ඇති/ හෝ පනවනු ලැබිය හැකි FATCA විධිවිධාන යටතේ හෝ වෙනත් යම් නියෝගයක්/ නියෝග යටතේ අවශ්‍යවේ නම් මාගේ ගිණුමෙන් (ගිණුම්වලින්) මුදල් හරකිරීම මගින් IRS වෙත හෝ වෙනත් යම් නියාමන අධිකාරියක්/ අධිකාරීන් වෙත ගෙවනු ලැබිය යුතු බදු සහ/හෝ ගාස්තු ප්‍රේෂණය කිරීම සඳහා බැංකුව වෙත මෙයින් තවදුරටත් බලය පවරනු ලැබේ.

(iv) ස්වකීය පදිංචිය/ පුරවැසිභාවයේ තත්ත්වය පිළිබඳ අනාගතයේදී යම් වෙනස්කමක් සිදුවුවහොත් ඒ පිළිබඳව බැංකුව වෙත දැනුම් දෙන බවට ගිණුම්හිමියා විසින් මෙයින් ප්‍රතිඥාදී සිටිනු ලැබේ.

**17. පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීම**

බැංකුවේ නිල වෙබ් අඩවියේ හෝ වෙනත් යම් නිල ප්‍රකාශනයක හෝ බැංකුවේ නිවේදනයක සඳහන් කාර්ය පටිපාටිය ප්‍රකාරව ප්‍රසිද්ධ කර ඇති ආකාරයට බැංකුව වෙත වාචිකව හෝ බැංකුවේ සමීපතම ශාඛාව හෝ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය හෝ ප්‍රධාන කාර්යාලය වෙත ලිඛිතව ඕනෑම පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම සඳහා ගිණුම් හිමියාට අයිතියක් ඇත්තේ ය. යම් පැමිණිල්ලක් විසඳා නොමැති

අවස්ථාවක දී, ගිණුම්හිමියා විසින් මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා හරහා හෝ ශ්‍රීලංකා මහ බැංකුව හරහා ඒ සඳහා සහනයක් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

**18. පැවරීම**

ගිණුම් හිමියාගෙන් තත්කාර්ය සඳහා පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව, අදාළ නියෝගවලට යටත්ව මේ යටතේ වූ NDB බැංකුවේ යම් හෝ සියලු අයිතිවාසිකම් වෙනත් යම් පාර්ශවයක් වෙත පවරා දීමේ අයිතිය NDB බැංකුව සතුවේ.

එම නිසා, NDB බැංකුව යම් ආයතනයක් සමග සම්බන්ධ කරන හෝ ඒකාබද්ධ කරන අවස්ථාවක දී, NDB බැංකුවේ සියලු අයිතිවාසිකම් සහ බැඳීම් එම සම්බන්ධ කිරීමේ හෝ ඒකාබද්ධ කිරීමේ ආයතනය වෙත ස්වයංක්‍රීයව පැවරෙන අතර එම පැවරීම බලාත්මක කිරීම සඳහා එවැනි තවදුරටත්වූ ලේඛන අවශ්‍ය නොවිය යුතු වේ. එම සම්බන්ධ කිරීම, පැවරීම හෝ පවරාදීම හේතුවෙන් ගිණුම්හිමියාගේ අයිතිවාසිකම් අඩු වී ඇති අවස්ථාවක දී, ඒ සඳහා ගිණුම්හිමියාගේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු වේ.

**19. E - ප්‍රකාශන**

(i) e - ප්‍රකාශනයක් ලබාගැනීමේ කාර්ය සඳහා බැංකුව වෙත නිවැරදි ඊමේල් ලිපිනයක් ලබාදීම සම්බන්ධයෙන් ගිණුම්හිමියා විසින් පරම වශයෙන් වගකියනු ලබන බවටත්, ඉන්පසුව නිදහස් කරනු ලබන ඇඩෝබ් ඇක්‍රොබෙට් 6 වන සංස්කරණය හෝ සංස්කරණ ගිණුම්හිමියා විසින් e - ප්‍රකාශන වෙත ප්‍රවේශවන්නා වූ ගිණුම්හිමියාගේ උපාංග මත ස්ථාපනය කරනු ලැබිය හැකි බවත් බාධාවකින් තොරව e -ප්‍රකාශනයක් ලබාගැනීම සහතික කිරීම සඳහා තැපැල් බහාලුම නිතරම පැහැදිලි කර තබනු ලබන බවටත් ගිණුම්හිමියා විසින් සහතික කර සිටිනු ලැබේ.

(ii) යම් වෙනසක් සිදුවන අවස්ථාවක දී, බැංකුව වෙත අලුත් ඊමේල් ලිපිනයක් සැපයීම සඳහා ගිණුම්හිමියා විසින් එකඟව සිටියි.

(iii) ගිණුම්හිමියාගේ ඉල්ලීම පරිදි බැංකු පාස්පොතක්/ කාලීන e - ප්‍රකාශන නිකුත්කරනු ලබන අතර එම බැංකු පාස්පොත්වල සහ ප්‍රකාශවල ආරක්ෂාව පිළිබඳව ගිණුම්හිමියා වගකියනු ලැබිය යුතුවේ. බැංකු පාස්පොත නැතිවුවහොත්, සොරකමකට ලක්වුවහොත් හෝ අස්ථානගත වුවහොත්/ බාධාවක් නිසා e - ප්‍රකාශන යොමුකල නොහැකි වුවහොත් සහ/හෝ නම් කරන ලද විද්‍යුත් ලිපිනය වෙනත් තැනැත්තකුගේ අනවසර භාවිතයට ලක්වුවහොත් ඒ පිළිබඳව බැංකුව වෙත නිවේදනය කරනු ලැබිය යුතුවේ.

(iv) ගිණුම්හිමියා විසින් නිතිපතා පාස්පොත යාවත්කාලීන කරනු ලැබිය යුතු අතර බැංකුවෙන් පිටත්ව යෑමට පෙර ගණුදෙනුකරු සෑහීමට පත්වන පරිදි සියලු තැන්පතු, ලාභය සහ මුදල් ආපසු ගැනීම් නිවැරදිව වාර්තාගතව පවතින බවට සහතිකවිය යුතුය. පරිගණකයෙන් මුද්‍රිත නොවන හෝ බැංකුවේ බලයලත් නිලධරයකුගේ අත්සන යටතේ ඇතුලත් නොකරන ලද වාර්තා සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු ආකාරයක වගකීමක් භාරගෙන සිටිනු නොලැබේ.

(v) බැංකු පාස්පොත ඉදිරිපත් කිරීමේ දී යථාපරිදි සම්පූර්ණකරන ලද මුදල් ආපසු ගැනීමේ ආකෘතිපත්‍රයක් මගින් මෙන්ම ATM යන්ත්‍ර හරහා මුදල් ආපසු ගැනීම් සිදුකල හැකිවේ. කිසිදු ආකාරයක තැනැත්තකුගේ කූට ක්‍රියාවක්, වංචාවක් හෝ අනිසි ක්‍රියාවක් නොසලකා හරිමින්, බැංකු පාස්පොත ඉදිරිපත් කරනු ලබන සහ ගිණුම්හිමියා විසින් අත්සන්කර ඇතැයි සලකනු ලබන අදාල මුදල් ආපසු ගැනීමේ

ආකෘතිපත්‍රය ඉදිරිපත් කරනු ලබන පාර්ශවය වෙත බැංකුව විසින් කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් වන ගිණුම්හිමියාගේ සමස්ථ වගකීමෙන් ගිණුම්හිමියා විසින් බැංකුව නිදහස්කරනු ලැබිය යුතු ය.

(vi) බැංකු පාස්පොතක් නැතිවී හෝ විනාශවී ඇති අවස්ථාවක දී, සෑහීමට පත්විය හැකි හේතු සහ ප්‍රමාණවත් හානිපූරණයක් ලබා ගැනීමෙන් පසුව ගිණුම්හිමියා විසින් සිදුකර ඇති ගණුදෙනු පිළිබඳ විස්තර අන්තර්ගතවන නව බැංකු පාස්පොතක් බැංකුව විසින් නිකුත්කල හැකි අතර එම පාස්පොතෙහි සඳහන්වන විස්තර ගිණුම්හිමියා විසින් නිවැරදි බවට පිළිගත යුතුවේ. බැංකු පාස්පොතක් නැවත නිකුත් කිරීම සම්බන්ධයෙන් ගාස්තුවක් අදාල වන්නේ ය.

**20. SMS සංඥා**

(i) සේවා සඳහා ලියාපදිංචිවී ඇති (ගනුදෙනුකරුවන් යනුවෙන් හඳුන්වන) ස්වකීය ගනුදෙනුකරුවන් සඳහා බැංකුව/ NDB බැංකුව ලබා දී ඇති SMS සංඥා සේවය (සේවා) භාවිත කිරීම සියලු අවස්ථාවලදී බැංකුවේ නිශ්චිත නියම හා කොන්දේසි මගින් පාලනය වේ. මෙම සේවා සඳහා ප්‍රවේශවීමට බැංකුව සමග ලියාපදිංචි වී ඇති අංකය සහිත ස්වකීය ජංගම දුරකථනය පමණක් ගිණුම්හිමියා විසින් භාවිත කරනු ලැබිය යුතු වේ. ගනුදෙනුකරු විසින් සියලු අවස්ථාවල දී සිම් කාඩ්පත සහ ජංගම දුරකථනය තමාගේ සන්තකයේ තබාගත යුතු වේ. ගනුදෙනුකරු විසින් බැංකුවේ නියම සහ කොන්දේසි සමග අනුකුලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවකදී සිදුවන සියලු ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ගනුදෙනුකරු පරම වශයෙන් වගකියනු ලැබිය යුතු වේ. සපයා ඇති ජංගම දුරකථන අංකය (අංක) පිළිබඳ යම් වෙනසක් සිදුවුවහොත්, එම වෙනස්කම් පිළිබඳව ගනුදෙනුකරු විසින් බැංකුව දැනුවත් කරනු ලැබිය යුතු ය.

(ii) බැංකුවේ පරම අභිමතය පරිදි වෙනස් කරනු ලැබිය හැකි වූ එක් එක් බැංකු සේවය වෙනුවෙන් බැංකුව විසින් අර්ථනිරූපණය කරනු ලබන අවම ගනුදෙනු සීමාවක් මත පදනම්ව ගනුදෙනුකරු වෙත SMS සංඥා එවනු ලැබේ.

(iii) NDB ඇමතුම් මධ්‍යස්ථානය ඇමතීම මගින් ගනුදෙනුකරු විසින් සිදුකරනු ලබන ඉල්ලීමක් මගින් ´ඕනෑම අවස්ථාවක දී සේවය අවසන් කරනු ලැබිය හැකි ය. එවැනි සෑම අවසන් කිරීමක්ම වහාම බලාත්මක විය යුතු ය.

(iv) බැංකුවේ වෙබ් අඩවියෙහි පූර්ව දැනුම්දීමක් සිදුකිරීම මගින් බැංකුව විසින් තීරණය කරන ගාස්තු යටතේ සහ බැංකුව විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් තුළදී බැංකුව විසින් බැංකු ගිණුම් ගනුදෙනු සඳහා ලැබෙන SMS සංඥා සේවය සඳහා වූ දායක මුදල් ගාස්තුව ගනුදෙනුකරුගේ මූලික පුද්ගල ගිණුමෙන් හර කරනු ලැබේ.

**21. NDB ඩෙබිට් කාඩ්පත්**

(i) අන්‍යාකාරයකින් ප්‍රකාශකර ඇත්නම් මිස, මේ වගන්තියේ භාවිත කර ඇති යෙදුම් සඳහා මෙම නියම හා කොන්දේසිවල ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

(අ) **"ATM"** යන්ත්‍රය යන්නෙන් NDB ඩෙබිට් කාඩ්පත ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලබන සියලු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර අදහස් වේ.

(ආ) **"කාඩ්පත් හිමියා"** යන්නෙන් මැන්ඩේට්පත්‍රය ප්‍රකාරව එහි සඳහන් පරිදි ගිණුම පවත්වාගෙන යෑම සඳහා බලය පවරා ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් අදහස් වේ.

(ඇ) **"කාඩ්පත් පහසුකම"** යන්නෙන් ATM ගනුදෙනු සහ සියලු ආශ්‍රිත කරුණු අදහස් වේ.

(ඈ) **"කාඩ්පත් ගනුදෙනුව/ ගනුදෙනු"** යන්නෙන් ATM යන්ත්‍ර සහ POS පර්යන්ත හරහා සකස්

කිරීමේ හැකියාව පවතින සියලු ගනුදෙනු අදහස් වේ.

(ඉ) **"NDB ඩෙබිට් කාඩ්පත"** යන්නෙන් යම් අලුත් කිරීමේ හෝ ප්‍රතියෝජන කාඩ්පතක් ද ඇතුලුව ATM යන්ත්‍ර සහ POS හරහා ව්‍යාපාර කටයුතු සිදුකිරීම සඳහා යම් කාඩ්පත් හිමියකුට බැංකුව විසින් නිකුත් කරනු ලබන VISA කාඩ්පත හෝ වෙනත් වෙළඳ නාමයක් යටතේ නිකුත් කරන ලද වෙනත් යම් කාඩ්පතක් අදහස් වේ.

(ඊ) **"PIN අංකය"** යන්නෙන් NDB ඩෙබිට් කාඩ්පත නිකුත් කරනු ලබන අවස්ථාවේ දී බැංකුව විසින් කාඩ්පත් හිමියාට නිකුත් කරනු ලබන පුද්ගල හඳුනාගැනීමේ අංකය හෝ NDB ඩෙබිට් කාඩ්පත් ගනුදෙනුවලට අදාලව කාඩ්පත් හිමියා හඳුනා ගැනීම සඳහා බැංකුව සමග සකස්කර ගනු ලබන කාඩ්පත්හිමියා විසින් පසුව ආදේශ කරනු ලබන යම් අංකයක් අදහස් වේ.

(උ) "POS" යන්නෙන් NDB ඩෙබිට් කාඩ්පත පිළිගනු ලබන ලෝකය පුරා සිටින වෙළඳුන් සමග පවතින අලෙවි පර්යන්ත ස්ථාන අදහස් වේ.

(ii) විකුණුම් වවුචරයක් අත්සන් කිරීම මගින් සහ NDB ඩෙබිට්කාඩ්පත මත මුද්‍රණය කර ඇති අංකය ඉදිරිපත් කිරීම මගින් NDB ඩෙබිට් කාඩ්පත පිළිගනු ලබන ලෝකය පුරා සිටින සිල්ලර වෙළඳුන් හෝ සැපයුම්කරුවන් වෙතින් කාඩ්පත් ක්‍රියාත්මකවන යන්ත්‍රයක් භාවිත කිරීම මගින් භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවීම් කිරීමට කාඩ්පත් හිමියා විසින් NDB ඩෙබිට් කාඩ්පත භාවිත කරනු ලැබිය හැකි අතර එසේ පිළිගනු ලැබූ කාඩ්පත් ගනුදෙනු මුදල බැංකුව විසින් ගිණුමෙන් හරකරනු ලැබේ.

(iii) ATM යන්ත්‍රවලින් මුදල් ආපසු ගැනීම සඳහා කාඩ්පත්හිමියා විසින් PIN අංකය ද සමගින් ඒකාබද්ධව NDB ඩෙබිට් කාඩ්පත භාවිත කරනු ලැබිය හැකි ය. කාඩ්පත්හිමියා විසින් එසේ ආපසු ලබාගන්නා මුදල ගිණුමෙන් හරකරනු ලැබේ.

(iv) අදාළ මුදල ගිණුමෙන් හරකරනු ලබන්නා වූ පරිදි මුදල් ආපසු ලබාගැනීම සඳහා NDB ඩෙබිට් කාඩ්පත පිළිගනු ලබන ඕනෑම බැංකුවක දී මුදල් ආපසු ලබා ගැනීම සඳහා හෝ වවුචරයක් අත්සන් කිරීම මගින් බලයලත් ආයතනවලින් භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම සඳහා කාඩ්පත් හිමියා විසින් NDB ඩෙබිට් කාඩ්පත භාවිත කරනු ලැබිය හැකි ය.

(v) කාඩ්පත් හිමියකුට කාඩ්පත් පහසුකම ප්‍රදානය කිරීම බැංකුවේ පරම අභිමතය පරිදි සිදුවන අතර කාඩ්පත් පහසුකම හරහා සිදු කරනු ලබන සියලු කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් වූ අවදානම් පිළිබඳව සියලු අවස්ථාවල දී කාඩ්පත්හිමියා වගකියනු ලැබිය යුතුය. කාඩ්පත් පහසුකම ආරම්භයේ දී මාස හැටක් (60) නොඉක්මවන කාලසීමාවක් සඳහා ප්‍රදානය කරනු ලබන අතර එම කාලසීමාව අවසානයේ දී බැංකුවේ පරම අභිමතය පරිදි නැවත අලුත් කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, කාඩ්පත් ආපසු ලබාගැනීම මගින්, අවලංගු කිරීම මගින් හෝ NDB ඩෙබිට් කාඩ්පත අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම මගින් ඕනෑම අවස්ථාවක දී පූර්ව නිවේදනයකින් තොරව සහ කාඩ්පත් හිමියා වෙත තත්කාර්ය සඳහා හේතු දැක්වීමකින් තොරව කාඩ්පත් පහසුකම අවසන් කිරීමේ නිදහස බැංකුව සතු වේ.

(vi) කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත දින හතකට (07) අඩුනොවන කාලයක් සඳහා පූර්ව ලිඛිත නිවේදනයක් ලබාදීම මගින් බැංකුව වෙත වහාම NDB ඩෙබිට් කාඩ්පත් ආපසු භාර දී ඒ සඳහා වලංගු රිසිට්පතක් ලබාගෙන ස්වකීය අභිමතය පරිදි කාඩ්පත් පහසුකම අවලංගු කරනු ලැබිය හැකි ය.

(vii) NDB ඩෙබිට් කාඩ්පත සියලු අවස්ථාවල දී බැංකුවේ දේපළක් වශයෙන් පැවතිය යුතු අතර කාඩ්පත් පහසුකම භාවිත කිරීම සඳහා බැංකුව විසින් බලය පවරා ඇත්තා වූ කාඩ්පත්හිමියා විසින් එම ඩෙබිට් කාඩ්පත පිටපත් කිරීම සඳහා උත්සාහ කිරීම හෝ එවැනි පිටපත් කිරීමක් අනුගමනය කිරීම සඳහා උත්සාහ කිරීම නොකළ යුතු ය.

(viii) ගිණුම (ගිණුම්) වසාදමා ඇත්නම් සහ/හෝ කාඩ්පත්හිමියා මියගොස් ඇත්නම් හෝ බැංකුව විසින් NDB ඩෙබිට් කාඩ්පත ආපසු භාරදෙන ලෙස කාඩ්පත් හිමියාට නියම කර ඇති අවස්ථාවක දී, NDB ඩෙබිට් කාඩ්පත ආපසු ඉල්ලා සිටීම/ ආපසු ලබාගැනීම සඳහා බැංකුවට හිමිකමක් ඇත්තේ ය.

(ix) බැංකුව සමග පවත්වාගෙන යනු ලබන ගිණුම යම් හේතුවක් නිසා වසා දමා ඇති අවස්ථාවක දී, බැංකුව විසින් හෝ බැංකුව වෙනුවෙන් ක්‍රියාකරනු ලබන යම් තැනැත්තකු විසින් NDB ඩෙබිට් කාඩ්පත අවලංගු කර ආපසු ඉල්ලා සිටීමේ නිවේදනයක් ලබාදීමෙන් පසුව සහ එය අවලංගු කිරීම සඳහා ආපසු ලබාදෙන ලෙස ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක දී, කාඩ්පත් හිමියා විසින් NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීමෙන් හෝ භාවිත කිරීමට උත්සාහ කිරීමෙන් වැළකී සිටින බවට එකඟව සිටිනු ලැබේ. PIN අංකය NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීමේ කාර්ය සඳහා නිකුත් කරනු ලැබ ඇති අතර එම කාර්ය සඳහා ආදේශ කරනු ලබන අංකය (අංක) දැඩි ලෙස රහසිගත වේ. ස්වේච්ඡාවෙන් හෝ අන්‍යාකාරයකින් කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ හෝ කිසිදු ක්‍රමයකින් PIN අංකය යම් තුන්වන පාර්ශවයක් වෙත හෙළිදරව් නොකළ යුතුය. NDB ඩෙබිට් කාඩ්පත යම් තුන්වන පාර්ශවයක් විසින් භාවිතා කිරීමේ හැකියාව ලැබෙන පරිදි කාඩ්පත්හිමියා විසින් කිසිදු ස්ථානයක හෝ කිසිදු ක්‍රමයකින් PIN අංකය පිළිබඳ කිසිදු ලිඛිත වාර්තාවක් පවත්වාගෙන නොයා යුතු ය.

(x) NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් ඕනෑම ආකාරයකින් සිදුවන කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් කාඩ්පත්හිමියා සියලු අවස්ථාවලදී වගකීමට බැඳී සිටිය යුතු අතර NDB ඩෙබිට් කාඩ්පත අනවසරයෙන් භාවිත කිරීම හෝ අදාළ PIN අංකය භාවිත කිරීම මගින් උපචිත වන සියලු පාඩු/අලාභ සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා විසින් බැංකුව හානිපූරණය කර තැබිය යුතු ය.

(xi) කාඩ්පත ලබා දී ඇත්තේ යම් කාඩ්පත් හිමියකු වෙත ද එම කාඩ්පත් හිමියා විසින් පමණක් කාඩ්පත් පහසුකම භාවිත කරනු ලැබිය යුතු අතර NDB ඩෙබිට් කාඩ්පතේ සපයා ඇති ස්ථානයෙහි කාඩ්පත්හිමියා විසින් ස්වකීය අත්සන තබනු ලැබිය යුතුය. ඔහු විසින් NDB ඩෙබිට් කාඩ්පත නැතිවීම/ සොරකමකට ලක්වීම වැළැක්වීම සඳහා සහ එහි PIN අංකය පිළිබඳව අනවසර තැනැත්තකු විසින් දැනුවත් වීම වැළැක්වීම සඳහා සියලු අවස්ථාවලදී හැකිතාක් දුරට නිසි උද්‍යෝගයෙන් ක්‍රියාකළ යුතුය. එවැනි ඕනෑම අවස්ථාවක දී කාඩ්පත්හිමියා විසින් වහාම බැංකුව වෙත දැනුම් දිය යුතුය. PIN අංකය නැතිවීම/ සොරකම් කිරීම හෝ අනවසරයෙන් භාවිත කිරීම පිළිබඳ බැංකුව වෙත තොරතුරු ලැබී ඇති බව බැංකුව විසින් කාඩ්පත්හිමියා වෙත තහවුරු කරනු ලබන තෙක්, NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් සිදුවන කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා සම්පූර්ණ වගකීම භාරගනු ලැබිය යුතු ය.

(xii) NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් සිදු කරනු ලබන ඉහත කී සියලු කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් හවුල් ගිණුම් හිමියන් එක්ව හා වෙන් වෙන්ව වගකියනු ලැබිය යුතුය.

(xiii) කාඩ්පත් හිමියා විසින් බැංකුව සමග එකඟ වූ අයිරා සීමාව හෝ ගිණුමේ (ගිණුම්වල) පවතින අරමුදල් ප්‍රමාණය ඉක්මවමින් NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් කිසිදු ආකාරයකින් NDB ඩෙබිට් කාඩ්පතට සම්බන්ධකර ඇති ස්වකීය ගිණුමෙන් (ගිණුම්වලින්) වැඩිපුර මුදල් ලබාගැනීම හෝ මුදල් ආපසු ලබාගැනීම/ මුදල් හුවමාරු කිරීම හෝ ගනුදෙනු කිරීම සිදුනොකළ යුතු ය.

(xiv) කාඩ්පත් හිමියකු සඳහා නිකුත් කරන ලද NDB ඩෙබිට් කාඩ්පත සහ PIN අංකය පවරනු නොලැබිය හැකි අතර එය ස්වකීය පරම භාවිතය සඳහා පමණක් වේ. PIN අංකය දැඩිලෙස රහසිගතව තබා ගැනීම සඳහා කාඩ්පත්හිමියා වගකිවයුතු අතර කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ කිසිදු අවස්ථාවකදී ස්වකීය PIN අංකය වෙනත් කිසිදු තැනැත්තකු වෙත හෙළිදරව් නොකරන බවට කාඩ්පත්හිමියා විසින් ප්‍රතිඥාදී සිටිනු ලැබේ.

(xv) කාඩ්පත්හිමියාගේ දැනුම හෝ අවසරය ඇතිව හෝ නොමැතිව NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් කරනු ලබන මුදල් ආපසු ගැනීම්/ හුවමාරු කිරීම්/ ගෙවීම් සම්බන්ධයෙන් වූ මුදල්, කාඩ්පත් හිමියාගේ නම්කල ගිණුමෙන් (ගිණුම්වලින්) හරකර ගැනීම සඳහා බැංකුවට බලය පවරා සිටිනු ලැබේ. එසේ වුව ද, එක් දිනයක දී සිදු කරනු ලබන ගනුදෙනුවල සම්පූර්ණ ප්‍රමාණය කලින් කල බැංකුව විසින් කාඩ්පත්හිමියා වෙත නිවේදනය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයකට සහ යම් කොන්දේසිවලට සීමාවිය යුතු ය.

(xvi) ඉහත කී සීමාව පිළිබඳ නොසලකා හරිමින්, NDB ඩෙබිට් කාඩ්පත හෝ වෙනත් යම් දේශීය ජාලයක් හරහා දේශීය වශයෙන් හෝ ජාත්‍යන්තර වශයෙන් සිදුකරනු ලබන කාඩ්පත් ගනුදෙනුවලට අදාල නෛතික සහ ව්‍යවස්ථාපිත ගාස්තු ද ඇතුලු සියලු ගාස්තු කාඩ්පත් හිමියාගේ නම්කල ගිණුමෙන් (ගිණුම්වලින්) හරකර ගැනීම සඳහා බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ.

(xvii) බැංකුව විසින් අයකරනු ලබන යම් අතිරේක ප්‍රතිශතයක් සහ VISA ඉන්ටර්නැෂනල් විසින් බැංකුවෙන් අයකරනු ලබන කාඩ්පත් ගනුදෙනු ගාස්තුව (ගාස්තු) සමග මුදල් පරිවර්තනය කරනු ලබන දිනයේ දී VISA ඉන්ටර්නැෂනල් විසින් අනුගමනය කරනු ලබන හුවමාරු අනුපාතිකය මගින් නිශ්චය කරනු ලබන යම් විනිමය අනුපාතිකයක් යටතේ ශ්‍රීලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමෙන් පසුව ශ්‍රීලංකා රුපියල් වලින් හැර වෙනත් ව්‍යවහාර මුදල් වලින් සිදුකරනු ලබන සියලු කාඩ්පත් ගනුදෙනු කාඩ්පත් ගිණුමෙන් හරකරනු ලැබේ.

(xviii) කාඩ්පත් ගනුදෙනු අවලංගු කිරීම, ප්‍රත්‍යාවර්තනය කිරීම හෝ ආපසු ලබාදීම හේතුවෙන් සිදුවන යම් හුවමාරු පාඩුවක් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා වගකියනු ලැබිය යුතු ය.

(xix) ATM තිරයේ දිස්වන හෝ ATM යන්ත්‍රය විසින් නිකුත් කරනු ලබන මුද්‍රිත විමසීම් පත්‍රිකාවේ හෝ රිසිට්පත්‍රයේ සඳහන් වන මුදල ඕනෑම ආකාරයක කාර්යයන් සඳහා බැංකුව සමග පවතින නම්කල ගිණුමේ (ගිණුම්වල) තත්ත්වය පිළිබඳ තීරණාත්මක සාක්ෂියක් ලෙස සලකනු නොලැබිය යුතු බවට ගිණුම්හිමියා පිළිගෙන සිටියි. NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් සකස් කරනු ලබන කාඩ්පත් ගනුදෙනු පිළිබඳ බැංකු වාර්තාව, 21(xi), 21(xii), 21(xiii) සහ 21(xiv) වගන්තිවලට යටත්ව සියලු කාර්ය සඳහා තීරණාත්මක සහ බැඳීම්සහගත විය යුතු ය.

(xx) NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් කරනු ලබන ගනුදෙනු පිළිබඳ වාර්තාව කාඩ්පත් හිමියා වෙත යවනු ලබන සාමාන්‍ය බැංකු

ප්‍රකාශවල ඇතුළත් කරනු ලැබිය යුතු අතර එම ප්‍රකාශන ගිණුම්හිමියා විසින් පරීක්ෂාකර බැලීමට නියමිත වන අතර එම ප්‍රකාශනවල යම් උද්දේශිත වරදක් ඇත්නම් ඒ පිළිබඳව කාඩ්පත් හිමියා විසින් එම ප්‍රකාශන දිනයේ සිට දින දාහතරක (14) කාලයක් ඇතුළත බැංකුව වෙත නිවේදනය කරනු ලැබිය යුතු අතර එම කාලසීමාවෙන් පසුව එහි සඳහන් ප්‍රකාශනය සහ ඇතුළත් කිරීම් (එසේ නිවේදනය කරන ලද වැරදි හැර) සියලු කාර්ය සඳහා බැංකුව සහ කාඩ්පත්හිමියා අතර වූ නිවැරදි ප්‍රකාශ සහ ඇතුළත් කිරීම් ලෙස තීරණාත්මකව සලකනු ලැබිය යුතු ය.

(xxi) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාරගෙන නොසිටියි; එනම්-

(අ) යම් වෙළඳ ආයතනයක් විසින් NDB ඩෙබිට් කාඩ්පත ගරුකිරීම හෝ පිළිගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබීම හෝ ඒ සඳහා අපොහොසත් වීම හෝ සම්පූර්ණ සහ අවසරලත් සීමාව සඳහා පහසුකම් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ එසේ කිරීමට අපොහොසත් වීම.

(ආ) NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් මිලදී ගනු ලබන හෝ ලබාගන්නා භාණ්ඩ සහ සේවාවල යම් දෝෂයක් හෝ ඌනතාවයක් තිබීම.

(ඇ) NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් භාණ්ඩ මිලදී ගැනීම හෝ සේවා ලබාගැනීම සඳහා කාඩ්පත් හිමියා දිරිගැන්වීම හෝ උනන්දු කරවනු ලැබීම මගින් යම් වෙළඳ දැන්වීමක, ප්‍රසිද්ධ කිරීමක හෝ ප්‍රවර්ධන සේවයක සිදුවන හෝ අන්තර්ගත වන යම් වැරදි සහගත නියෝජනය කිරීම්,

(ඈ) ATM යන්ත්‍රයක් බිඳවැටීම හෝ අක්‍රියවීම හෝ දෝෂ සහිත වීම නිසා හෝ එවැනි හේතුවකින් උපචිතවන හෝ සන්නිවේදන පද්ධතියක් හෝ පහසුකම් හෝ දත්ත සැකසුම් පද්ධතියක් හෝ සම්ප්‍රේෂණ සම්බන්ධතාවක් බිඳවැටීම හෝ අක්‍රීය වීම හෝ දෝෂ සහිත වීම හේතුවෙන් හෝ කාර්මික හෝ වෙනත් යම් ආරවුලක් හෝ වෙනත් හේතුවක් නිසා හෝ බැංකුවේ පාලනයෙන් පරිභාහිරව පවතින හේතුවක් නිසා හෝ අන්‍යාකාර හේතුවක් නිසා සිදුවන ඕනෑම ආකාරයක අපහසුතාවයක්, පාඩුවක්, අලාභයක් හෝ පීඩාවක්.

(xxii) NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් සිදුකරනු ලබන සියලු කාඩ්පත් ගනුදෙනු සියලු අවස්ථාවල දී:-

(අ) (ලෝකය පුරා දේශීය සහ විදේශීය ව්‍යවහාර මුදලින් පුද්ගලික වියදම් සඳහා කාඩ්පත් හිමියා විසින් NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම ඇතුලු ඊට සීමා නොවන්නා වූ) කාඩ්පත් ගණුදෙනු සිදු කරනු ලබන අවස්ථාවේ දී පවතින විදේශ විනිමය නියෝගවලට එකඟ බවට; සහ

(ආ) නෛතික කාර්ය සඳහා, තුන්වන පාර්ශව වෙනුවෙන් කරනු ලබන භාහිර ගෙවීම් විනිමය පාලන නියෝග උල්ලංඝනය කරමින් සිදුවේ ද යන්න පිළිබඳව;

කාඩ්පත්හිමියා සහතික විය යුතු ය.

(xxiii) බැංකුව විසින් උචිත බවට තීරණය කරනු ලබන ආකාරයට කලින් කල මෙම නියම හා කොන්දේසි වෙනස් කිරීමේ, විවිධාංගීකරණය කිරීමේ, සංශෝධනය කිරීමේ, ආපසු ලබාගැනීමේ, අලුත් කිරීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව විසින් තමාවෙත රඳවාගනු ලැබේ. කාඩ්පත් හිමියා වෙත ලබාදෙන නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි එම වෙනස් කිරීම බලාත්මක වන දිනයෙන් පසුව කාඩ්පත් හිමියා විසින් NDB ඩෙබිට් කාඩ්පත භාවිතකිරීම මගින් සීමා කිරීමකින් තොරව එම වෙනස්කම පිළිගෙන ඇති ලෙස සලකනු ලැබිය යුතු ය. කාඩ්පත් හිමියා විසින් එම වෙනස් කිරීම

පිළිනොගනී නම්, NDB ඩෙබිට් කාඩ්පත බැංකුව වෙත ආපසු භාර දී ඒ සඳහා වලංගු රිසිට්පතක් ලබාගත යුතු ය.

(xxiv) තත්කාර්ය සඳහා කාඩ්පත් හිමියාගෙන් පූර්ව අවසරයක් ලබාගැනීමෙන් තොරව මේ යටතේ වූ බැංකුවේ යම් හෝ සියලු අයිතිවාසිකම් වෙනත් යම් පාර්ශවයක් වෙත පැවරීමේ අයිතිය බැංකුව සතුවේ.

(xxv) ඉස්ලාම් මූලධර්මවලට අනුකූල නොවන භාණ්ඩ හෝ සේවා අන්තර්ගත වන යම් ගනුදෙනු කටයුත්තක් සඳහා කාඩ්පත්හිමියා විසින් මෙම කාඩ්පත භාවිත නොකළ යුතු වේ.

**22. තැන්පතු රක්ෂණ ආවරණය**

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (එන්ඩීබී බැංකුව) වෙත නිකුත්කරන ලද බැංකු බලපත්‍රය ශ්‍රීලංකා මහබැංකුව (CBSL) විසින් අවලංගු කරනු ලැබුවහොත්, කලින්කල CBSL විසින් නිශ්චය කරනු ලබන උපරිම මුදලක් දක්වා යෝග්‍ය තැන්පතුකරුවන් වෙත වන්දිපූරණය කිරීමේ අරමුණින් යුතුව, ශ්‍රීලංකා මහබැංකුව (CBSL) විසින් නිකුත්කරනු ලබන තත්කාලයේ බලපවත්නා විධාන හා නියෝග ප්‍රකාරව ශ්‍රීලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය යටතේ සියලු යෝග්‍ය තැන්පතුකරුවන් රක්ෂණය කරනු ලැබේ.

**23. පොදු විධිවිධාන**

(i) අදිසි තත්ත්වයන් නිසා ගිවිසුමක් සපුරාලීමට නොහැකි වීමද ඇතුලුව බැංකුවේ පාලනයෙන් පරිභාහිරව පවතින යම් හේතුවක් නිසා (ඍජුව හෝ වක්‍රව) යම් සේවයක් ලබාදීමට නොහැකිවීම හෝ ප්‍රමාද වීම හෝ මේ යටතේ වූ වගකීම් සපුරාලීමට නොහැකි වීම හෝ ප්‍රමාදවීම සම්බන්ධයෙන් බැංකුව වගකීමට බැඳී නොසිටියි.

(ii) බැංකුව විසින් ලබාදෙන නිෂ්පාදන සහ සේවා මෙන්ම ඒවාට අදාළ නියම හා කොන්දේසි සඳහා සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් යමක් එකතු කිරීමේ, ප්‍රතිශෝධනය කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ අවලංගු කිරීමේ අයිතීන් බැංකුව විසින් තමා වෙත රඳවා ගනු ලැබේ. එවැනි යම් එකතු කිරීමක්, ප්‍රතිශෝධනය කිරීමක්, සංශෝධනය කිරීමක්, අවලංගු කිරීමක් හෝ වෙනස් කිරීමක් බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීම මගින් ගිණුම්හිමියාගේ අවධානයට ඉදිරිපත් කළ අවස්ථාවේ සිට බලාත්මක වන මෙන්ම බැඳිම් සහගත වේ.

(iii) ලිපිනයද ඇතුලුව ගිණුම්හිමියාගේ පුද්ගලික තොරතුරුවල සිදුවන වෙනස්කම් ප්‍රමාදයකින් තොරව ගිණුම්හිමියා විසින් බැංකුව වෙත දැනුම්දිය යුතු වේ.

(iv) වෙළඳපල තත්ත්වයන් මත රඳා පවතිමින් තත්කාලයේ පවතින ත්‍යාග යෝජනාක්‍රමය වෙනස් කිරීම සඳහා බැංකුවට අයිතියක් ඇති අතර එම වෙනස්කම් බැංකු වෙබ් අඩවියේ සහ බැංකුවේ එක් එක් ශාඛාවේ දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කරනු ලැබේ.

**24. පාලන නීතිය**

මෙම නියම හා කොන්දේසි ශ්‍රී ලංකාවේ නීතිය මගින් පාලනය වන මෙන්ම එසේ පාලනය වන ලෙස සලකනු ලැබිය යුතු අතර ශ්‍රීලංකාවේ අනන්‍ය අධිකරණ බලය වෙත ගිණුම්හිමියා විසින් මෙම නියම හා කොන්දේසි සම්බන්ධ කාරණා තීරණය කිරීම සඳහා වෙනස් කළ නොහැකි ලෙස භාර දී සිටිනු ලැබේ. වෙනත් යම් අධිකරණ කලාපයක දී මට එරෙහිව නඩු පැවරීම සඳහා එම භාරදීම බැංකුවේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අගතිගාමී නොවිය යුතු ය.

**ගනුදෙනුකරුගේ ප්‍රකාශය**

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී ආයතනය සමඟ පවතින අපගේ සම්බන්ධතාවය ඉහත සඳහන් නියම හා කොන්දේසිවලට යටත්වන බවටත් එම නියම සහ කොන්දේසි මා/අප විසින් කියවා පැහැදිලි කර ගෙන සහ අවබෝධ කරගෙන එම නියම හා කොන්දේසි මගින් බැඳී සිටීමට එකඟව සිටින බවත් මා/අප විසින් මෙයින් තහවුරු කර පිළිගෙන සිටිනු ලැබේ. බැංකුව විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි තවදුරටත් වූ විස්තර හෝ ලේඛන සැපයීමටද මා/අප විසින් එකඟව සිටිනු ලැබේ. මා/අප විසින් සපයනු ලබන තොරතුරුවල යම් වෙනස්කමක් සිදුවුවහොත් ඒ පිළිබඳ බැංකුව වෙත දැනුම් දෙන බවට මා/අප විසින් ප්‍රතිඥාදී සිටිනු ලැබේ.